අන්තර්ගතය

		පිටුව
1 කොටස	දැක්ම පිළිබඳ ප්‍රකාශය	01
2 කොටස	මෙහෙවර පිළිබඳ ප්‍රකාශය	01
3 කොටස	ඉලක්ක	01
4 කොටස	පාලක සභාව	02
5 කොටස	උපකුලපතිවරයාගේ සමාලෝචනය	03-13
6 කොටස	සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර	14
7 කොටස	දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර	15-21
8 කොටස	විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර	22
9 කොටස	අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	23
10 කොටස	අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	24-25
11 කොටස	පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර	26
12 කොටස	වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර	27-28
13 කොටස	ලද සම්මාන පිළිබඳ විස්තර	29

14 කොටස	ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර	29
15 කොටස	පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර	30
16 කොටස	ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර	30
17 කොටස	ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය / විදේශීය අරමුදල් ලද)	31
18 කොටස	ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය / විදේශීය අරමුදල් ලද)	32-33
19 කොටස	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)	34
20 කොටස	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)	34
21 කොටස	මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය	35
22 කොටස	යටිතල පහසුකම් පිළිබඳ විස්තර	36
23 කොටස	මූල්‍ය ගිණුම් සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2011	
	23.1 2011.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	37
	23.2 2011.12.31 දිනට මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය	38
	23.3 2011.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	39
	23.4 2011.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය	40
	23.5 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයට සටහන්	41-45
	23.6 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයට සටහන්	46-48
	23.7 විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස්	49-84
	23.8 ව්‍යවස්ථාපිත මණ්ඩලවල මූල්‍ය කාර්යසාධනය – 2011	85

1. දැක්ම පිළිබඳ ප්‍රකාශය

වඩාත්ම ගෝලීයව පිළිගත් ආසියාවෙහි දැනුම් ව්‍යාවසාය වීම.

2. මෙහෙවර පිළිබඳ ප්‍රකාශය

- මනස විමසීම පෝෂණය කරන සහ අභියෝගයන්ගේ විවිධත්වයක් සඳහා නිපුනතා වැඩිදියුණු කරන පරිවර්තනාත්මක අධ්‍යාපනය සැපයීමෙන්;
- දැනුමේ සීමාවන් පුළුල් කිරීමට ජාතිකව අදාළ සහ ඉහළතම බලපෑමක් සහිත පර්යේෂණ කරගෙන යාමෙන්;
- ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමෙන් සහ තාක්ෂණික හුවමාරුවට පහසුකම් සැලසීමෙන්;
- අන්තර්ජාතිකව ස්ථානගත වූ ජාතික විශ්වවිද්‍යාලයක් ලෙස රජයට, කර්මාන්තයට සහ සමාජයට විශේෂඥ සේවා සැපයීමෙන්; සහ
- ශ්‍රී ලංකාවේ තිරසාර, විද්‍යාත්මක, තාක්ෂණික, සමාජයීය සහ ආර්ථික සංවර්ධනයට දායකවීමෙන්.

ආසියාවෙහි තාක්ෂණිකමය සහ ආශ්‍රිත පුහුණු කිරීම් සඳහා ප්‍රමුඛ දැනුම් ව්‍යාවසාය වීම

3. ඉලක්ක

1වන ඉලක්කය: උසස් අධ්‍යාපනයෙහි විශිෂ්ටතාවයේ මධ්‍යස්ථානයක් ලෙස අන්තර්ජාතික පිළි ගැනීම මුදුන් පමුණුවා ගැනීම.
2 වන ඉලක්කය: ජාතික අදාළකත්වය සහ අන්තර්ජාතික පිළිගැනීම සමග පර්යේෂණ, නවෝත්පාදන සහ නිර්මාණකත්වය තුළ විශිෂ්ටත්වය මුදුන්පමුණුවා ගැනීම.
3 වන ඉලක්කය: ජාතික අවශ්‍යතාවයට සහ කර්මාන්තයේ අභිමතාර්ථ වලට ප්‍රතිචාර වශයෙන් අධ්‍යායපනය සපයන ප්‍රමබ විශ්වවිද්‍යාලයක් වීම.
4 වන ඉලක්කය: එහි ක්‍රියාකාරකම් තුළ විශිෂ්ටත්වය මුදුන් පමුණුවා ගැනීමට බුද්ධිමය, භෞතික සහ සමාජ පරිසරයක් නිර්මාණය කිරීම.
5 වන ඉලක්කය: මනාව උගත් ප්‍රජාවක් සහ දීප්තිමත් විශ්වවිද්‍යාලයක සහ වෙනස්වන සමාජයක අභියෝග වලට මුහුණ දීමට ලොල්වූ ආකල්ප ඇති නිපුණ සහ තෘප්තිමත් කාර්ය මණ්ඩලයක් සහ ශිෂ්‍යයන් බිහි කිරීම.
6 වන ඉලක්කය: උසස් තාක්ෂණය සහ වෙනත් විශේෂඥ සේවා පිළිබඳ ප්‍රමුඛ උපදේශකයා සහ සපයන්නා බවට පත්වීමට.
7 වන ඉලක්කය: ශ්‍රී ලංකාවේ සියළු අදාළ ක්ෂේත්‍රයන් සහ උසස්/වෘත්තීය අධ්‍යාපනය තුළ ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ජාතික සංවර්ධනයේ දී රජයේ උපදේශකයා වීම.
8 වන ඉලක්කය: තත්ව පාලනය සහ කාර්යක්ෂම සංස්ථාපිත පාලනයක් සඳහා යාන්ත්‍රණයක් ආයතනගත කිරීම.

4. පාලක සභාව

නිල බලයෙන් සාමාජිකයන් :

උපකුලපති (සභාපති)	මහාචාර්ය. කේ.ඒ.එම්.කේ. රණසිංහ (2011.11.27 දක්වා)
	මහාචාර්ය. ඒ.කේ.ඩබ්ලිව්. ජයවර්ධන (2011.11.28 සිට)
නියෝජ්‍ය උපකුලපති	මහාචාර්ය. එන්.ඩී. ගුණවර්ධන
පීඨාධිපති, වාස්තුවිද්‍යා පීඨය	මහාචාර්ය. පී.කේ.එස්. මහනාම
පීඨාධිපති, ඉංජිනේරු පීඨය	මහාචාර්ය. යූ.ජී.ඒ. පුස්වැවල
පීඨාධිපති, තොරතුරු තාක්ෂණ පීඨය	මහාචාර්ය. ඒ.එස්. කරුණානන්ද

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව මගින් පත් කළ සාමාජිකයන් :

කේ.යූ. පුෂ්පකුමාර මහතා
එල්.ජේ.කේ හෙට්ටිආරච්චි මහතා (30.06.2011 දක්වා)
ඒ. වීරසිංහ මහතා (30.06.2011 දක්වා)
ජී.කේ. අමරතුංග මහතා (30.06.2011 දක්වා)
එල්.යූ.ජී. කුරුප්පු මහතා (01.07.2011 දක්වා)
පාලිත ප්‍රනාන්දු මහතා (01.07.2011 දක්වා)
එස්. ස්වර්ණජෝති මහතා (31.01.2011 දක්වා)
මහාචාර්ය. එන්. ද සිල්වා මිය (01.07.2011 සිට)
මේජර් ජනරාල් එම්. පීරිස් (01.07.2011 සිට)
ආචාර්ය ආර්.එල්. ඩබ්. කොග්ගලගේ (01.07.2011 සිට)
ජේ. කුරුකුලසූරිය මහතා (01.07.2011 සිට)
බී.එච්.එම්. රත්නසිරි මහතා (01.07.2011 සිට)
කේ. ඉද්දමල්ගොඩ මිය (01.07.2011 සිට)
ශ්‍රේෂන් ඒ. පීරිස් මහතා (01.07.2011 සිට)

සනාථන සභාව මගින් තෝරාගත් සාමාජිකයින් : මහාචාර්ය ජේ.ආර්. ලූකස්
මහාචාර්ය එම්.එස්. මානවඩු

ලේඛකාධිකාරි (ලේකම්) : ඒ. එල්. ජවුෆර් සාදික් මහතා

මූල්‍යාධිකාරි (ඇරයුම මත) : ඊ.එම්.ආර්.එල්. මුණවීර මහතා (31.08.2011 දක්වා)
පී.ඒ. ගුණතිලක මහතා
(වැඩබලන මූල්‍යාධිකාරි: 01.09.2011 සිට)

5. උපකුලපතිවරයාගේ සමාලෝචනය

1960 වර්ෂයේදී පිහිට වූ කටුබැද්ද ප්‍රායෝගික තාක්ෂණ ආයතනයට සහ 1966 වර්ෂයේදී පිහිට වූ ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යායතයනයට අනුප්‍රාප්තික, මොරටුව විශ්වවිද්‍යාලය (UOM) 1972 වර්ෂයේ පෙබරවාරි මස 15 වන දින කටුබැද්ද සරසවිය ලෙස කටයුතු කිරීම අරඹන ලදී.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදනයන් යටතේ, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කටුබැද්ද සරසවිය එහි වර්තමාන "මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව" යන ව්‍යවස්ථාපිත නාමය සහිතව ස්වාධීන විශ්වවිද්‍යාලයක තත්ත්වය අත්කර ගන්නා ලදී. වර්තමානයේදී, මොරටුව විශ්වවිද්‍යාලය නම් වශයෙන් කිවහොත් වාස්තුවිද්‍යා, ඉංජිනේරු සහ තොරතුරු තාක්ෂණය යන පීඨ තුනකින් සමන්විත වන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC) විසින් තෝරාගත් ශිෂ්‍යයන් වෙත ප්‍රථම උපාධි වැඩසටහන් එකොලහ (11) ක් සහ පශ්චාත් උපාධි වැඩසටහන් පනස් හයක් (56) පිරිනමයි.

මොරටුව විශ්වවිද්‍යාලය යනු අවිවාදයෙන්ම අද ශ්‍රී ලංකාවේ **සමස්ත වශයෙන් විශිෂ්ඨතම** විශ්වවිද්‍යාලය වේ. මොරටුව විශ්වවිද්‍යාලයේහි කෙටිකාලීන මෙහෙවර වන්නේ "ලෝක පූජිත විශ්වවිද්‍යාලයක ඕනෑම පශ්චාත් උපාධි වැඩසටහනකට ප්‍රවේශය ලබාගත හැකි සහ උසස් අධ්‍යාපනයෙන් සහ ප්‍රායෝගික රැකියාවෙන් යන දෙයාකාරයෙන්ම අන්තර්ජාතිකව පිළිගත් ලෝක පූජිත විශ්වවිද්‍යාලයක් වෙතින් පිටවන ඕනෑම උපාධිධරයෙකු සේම ක්‍රියා කළ හැකි තාක්ෂණික ක්ෂේත්‍රය තුළ ලෝක පූජිත උපාධිධාරීන් බිහිකිරීමයි". මෙය සිදු කිරීමට ඇත්තේ අපගේ ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය සඳහා තෘප්තිකර අත්දැකීමක් සපයන පරිසරයක් තුළ වන අතර එයින් ජාතිකව අදාළ සහ අන්තර්ජාතිකව පිළිගත් විශ්වවිද්‍යාලයක් වීමයි.

එමනිසා මොරටුව විශ්වවිද්‍යාලය හි අරමුණ වන්නේ, පළමු දින සිට කාර්යයක යෙදවිය හැකි, මනා විද්වත්භාවයකින් හෙබි, ආත්ම විශ්වාසී, නම්‍යශීලී, අතිශයින් කාර්යයක යෙදවිය හැකි, අන්තර්ජාතිකව පිළිගත් උසස් තත්වයේ උපාධිධාරීන් බිහි කිරීම සහ ඔවුන් උපාධි ලබන විට "රැකියා සොයන්නන්" නොව "රැකියා තනන්නන්" බවට පත් කිරීමට අපගේ ශිෂ්‍යයන්ව පුහුණු කිරීමටයි. බොහෝ දෙනෙකුට අවබෝධ වී නොමැත්තේ මොරටුව විශ්වවිද්‍යාලය විසින් අපගේ නව උපාධිධාරීන්ගේ බොහොමයකගේ වාර්ෂික වැටුපට වඩා අඩු එනම් **දළ වශයෙන් එක් ශිෂ්‍යයෙකුට ඇමෙරිකානු ඩොලර් 6000 ක පිරිවැයකට** ඉංජිනේරු විද්‍යාව, වාස්තු විද්‍යාව, ප්‍රමාණ සමීක්ෂණය, මෝස්තර නිර්මාණ ශිල්පය, නගර සහ ග්‍රාම සැලසුම්කරණය සහ තොරතුරු තාක්ෂණය තුළ අතිශයින් කාර්යයක යෙදවිය හැකි ලෝක පූජිත තත්වයේ උපාධිධාරීන් බිහිකරන බවයි.

මෙම වටපිටාව සහිතව, මෙම වාර්තාව පළමුව මොරටුව විශ්වවිද්‍යාලයෙහි ජයග්‍රහණයන් සහ 2011 වර්ෂයේ කාර්යමණ්ඩල සහ ශිෂ්‍ය ක්‍රියාකාරකම් යන දෙආකාරයෙන්ම අත්කර ගත් පිළිගැනීම දෙස බලයි. ඉන්පසු එය ආයතනික සැලසුම් දර්ශ, රජය මගින් කළ ප්‍රාග්ධන ආයෝජන සහ විශ්වවිද්‍යාලය සහ කර්මාන්තය අතර අන්තර්ක්‍රියා දෙස බලයි. එහි මූලෝපායික සංවර්ධනය වළකන විශ්වවිද්‍යාලය විසින් මුහුණ දුන් බාධක පිළිබඳ කෙටි ප්‍රකාශයකින් සමාලෝචනය නිමාවට පත්වේ.

5.1 ජයග්‍රහණයන් සහ පිළිගැනීම්

2000 වර්ෂයේදී, විශ්වවිද්‍යාලයෙන් වෙන්ව ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (NDT) වැඩසටහන පිරිනැමීමට මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණ ආයතනය (ITUM), මොරටුව විශ්වවිද්‍යාලය මගින්

පිහිටුවන ලදී. එම කාලයේදී, 2300 ක උපාධි අපේක්ෂක ශිෂ්‍ය ප්‍රජාවක් සහිතව විශ්වවිද්‍යාලයට ඉංජිනේරු විද්‍යා සහ වාස්තු විද්‍යා නමින් පීඨ දෙකක් තිබුණි. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහනට ශිෂ්‍යයන් 1050 ක් සිටියහ. ඉදි කළ පරිසරය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය යන උපාධි වැඩසටහන් දෙක වාස්තුවිද්‍යා පීඨය පිරිනැමූ අතර ඉංජිනේරු විද්‍යා පීඨය ශාස්ත්‍ර ධාරා ශාඛා නමයකින් ඉංජිනේරු විද්‍යා විද්‍යාවේදී උපාධිය යන තනි උපාධි වැඩසටහන පිරිනමන ලදී.

2011 වර්ෂය වනවිට, 6051 ක උපාධි අපේක්ෂක ශිෂ්‍ය ප්‍රජාවක් සහිත පීඨ තුනක් සහ එම පරිශ්‍රය තුළම සිසුන් 1050 ක ජාතික තාක්ෂණ ඩිප්ලෝමා ආයතනයක් තිබුණි. ඉංජිනේරු පීඨය උපාධි වැඩසටහන් තුනක් පිරිනමයි. එනම් ඉංජිනේරු විද්‍යා විද්‍යාවේදී උපාධිය, ප්‍රවාහනය සහ සැපයුම් සංවිධාන කළමනාකරණ විද්‍යාවේදී උපාධිය සහ මෝස්තර නිර්මාණකරණ සහ නිෂ්පාදන සංවර්ධන විද්‍යාවේදී උපාධිය - සියල්ලම වර්ෂ හතරේ ගෞරව උපාධි වැඩසටහන්ය. වාස්තුවිද්‍යා පීඨය උපාධි වැඩසටහන් පහක් පිරිනමයි, එනම වාස්තුවිද්‍යා විද්‍යාවේදී උපාධිය, නිර්මාණකරණ විද්‍යාවේදී උපාධිය, ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාවේදී උපාධිය, පහසුකම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය, සහ ග්‍රාම සහ නගර සැලසුම්කරණ විද්‍යාවේදී උපාධිය වේ. තොරතුරු තාක්ෂණ පීඨය උපාධි වැඩසටහන් තුනක් පිරිනමයි, එනම් තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධිය, තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය, සහ තොරතුරු තාක්ෂණ සහ කළමනාකරණ විද්‍යාවේදී උපාධිය වේ. ඊට අමතරව, තොරතුරු තාක්ෂණ පීඨය හවුල්කාර ආයතනවල සහාය ඇතිව බාහිරව ඉදිරිපත් කරන වැඩසටහනක් ලෙස තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධි වැඩසටහන පිරිනමයි. තොරතුරු තාක්ෂණ සහ කළමනාකරණ විද්‍යාවේදී උපාධි වැඩසටහන 2011 වර්ෂයේදී ආරම්භ කළ නව වැඩසටහනකි. විශ්වවිද්‍යාලය 2011 වර්ෂයේදී එහි මුලු ශිෂ්‍ය බල ඇණියම ඇතුළත් කර ගත් ප්‍රථම විශ්වවිද්‍යාලය වෙමින් උපාධි අපේක්ෂකයන් 1370 දෙනෙකු ඇතුළත් කර ගත්තේය.

අවසාන වසර නමය ඇතුලත ශිෂ්‍යයින් 2300 සිට 6051 දක්වා උපාධි අපේක්ෂක ජනගහනයේ 163% ක ඉහළ වර්ධනය හා වර්ෂ 2007 සිට 2011 දක්වා වාර්ෂික බඳවා ගැනීමේ 27% ක වර්ධනය තාක්ෂණික පුහුණුව තුළ අපගේ උපාධි පාඨමාලාවට ශිෂ්‍යයින්ගේ හා ඔවුන්ගේ දෙමාපියන්ගේ ඇති ඉල්ලුමේ වර්ධනය ලඟාකර ගැනීම අර්ථාන්විත සහ සැලකිය යුතු බව මතුකර දැක්විය යුතුයි.

2007 සහ 2011 අතරතුර වාර්ෂික බඳවා ගැනීම් 27% ක ඉහල හා වසර නමයක් වැනි කෙටි කාලාන්තරයක් තුළ සහ සීමිත පහසුකම් සහිතව ශිෂ්‍ය ප්‍රජාව දෙගුණයකට අධිකව වර්ධනයක් තිබියදී ද සියලුම උපාධිධාරීන්ගේ අදාළත්වය හා ගුණාත්මක බව වර්ධනය වී තිබීම ගැන මොරටුව විශ්වවිද්‍යාලය සාඩම්බර වේ. 2011 දී උපාධිධාරීන්ගේ සේවානියුක්ති රටාව පිළිබඳව කරන ලද සමීක්ෂණයකදී කර්මාන්ත හා එහි සේව්‍යයන් මොරටුව විශ්වවිද්‍යාලයෙහි උපාධිධාරීන් හට බොහෝ කැමැත්තක් දක්වන බව පෙන්වමින් සියලුම උපාධිධාරීන් අතුරින් 95% ක් හා ඉංජිනේරු උපාධිධාරීන්ගෙන් 99.6% ක් ඔවුන්ගේ අවසාන විභාගයට පසුව මාස 3 ක් ඇතුළත සේවයේ නියුක්ත බව වාර්තා වී ඇත.

2011 දී අවසාන විභාගයට පෙනීසිටි සිසුන් 1116 න් 994 (89%) ක් ප්‍රථම උපාධිය ලබාගැනීමට නියමිත අවම ගිවිසුම් කාල පරිච්ඡේදය තුළ උපාධිය ලැබීය. 2011 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවයේ දී පශ්චාත් උපාධි ඇතුළුව පිරිනැමූ උපාධි 1317 න් 1055 ක් ප්‍රථම උපාධි සහ 262 ක් පශ්චාත් උපාධි වේ.

2006 දී මොරටුව විශ්වවිද්‍යාලය එහි ප්‍රථම විවෘත හා දුරස්ථ ඉගෙනුම් ආකාරයේ (ODL) බාහිර උපාධි පාඨමාලාව වන තොරතුරු තාක්ෂණවේදී (BIT) උපාධිය ආරම්භ කළේය. විශ්ව විද්‍යාලයේ උසස් ගුණත්වයෙන් යුතු අධ්‍යාපනය ප්‍රදානයට උසස් පෙළ සුදුසුකම්ලත් සිසුන් විශාල ප්‍රමාණයක් විශේෂයෙන්ම ගම්බද ප්‍රදේශ වලින් ඇතුළත් කර ගැනීම ඉහළ නැංවීමට විශ්වවිද්‍යාලයට හැකිවන

මාර්ගයක් ලෙස මොරටුව විශ්වවිද්‍යාලයහි ප්‍රධාන සැලැස්ම විසින් විවෘත හා දුරස්ථ ඉගෙනුම් ආකාර හඳුනා ගනී. 2011 දී තොරතුරු තාක්ෂණවේදී බාහිර උපාධි පාඨමාලාවේ ප්‍රථම සිසුන් කණ්ඩායම උපාධි ලබාගත්හ.

සියලුම අධ්‍යයන කාර්යය මණ්ඩලයට අත්‍යාවශ්‍ය ක්‍රියාකාරකමක් ලෙස මොරටුව විශ්වවිද්‍යාලය පර්යේෂණ සලකයි. ජාත්‍යන්තරව හා දේශීයව යන දෙයාකාරයෙන්ම බාහිර අරමුදල්කරණ නියෝජිතායතන වෙතින් සහ සෙනට් පර්යේෂණ කාරක සභාව (SRC) හරහා විශ්වවිද්‍යාලය වෙතින් ප්‍රධාන වශයෙන් පර්යේෂණ සඳහා අරමුදල් පැමිණේ. 2011 දී විශ්වවිද්‍යාලය බාහිර අරමුදල්කරණ නියෝජිතායතන වෙතින් රු. මිලියන 9.2 ක් ලැබීය. ඊට අමතරව සෙනට් පර්යේෂණ කාරක සභාව හරහාද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ ව්‍යපෘති සඳහා විශ්වවිද්‍යාලය අරමුදල් සැපයීය. 2011 දී සෙනට් පර්යේෂණ කාරක සභාව මගින් පර්යේෂණ කටයුතු සඳහා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර රු මිලියන 4.8 ක් වැය කළේය.

2011 වර්ෂය මොරටුව විශ්වවිද්‍යාලයට බොහෝ ක්ෂේත්‍රයන්හි එහි කාර්ය මණ්ඩල හා ශිෂ්‍ය කාර්ය සාධනය හරහා ලොව පුරා පිළිගැනුම් ලැබූ ඉතා අනර්ඝ වර්ෂයකි.

සිසුන්ගේ කුසලතාව, නිර්මාණශීලීත්වය සහ කාර්ය සාධනය මැනීමට වඩාත්ම පිළිගත් ජාත්‍යන්තර තරඟයන්ගෙන් එකක් වන **Google Summer of Code (GSoC)** හිදී මොරටුව විශ්වවිද්‍යාලය සිය ආධිපත්‍යය නොකඩවා දැරීය. 2011 තරඟයේ ප්‍රදානයන් 27ක් සමග ලෝකයේ ප්‍රථම ස්ථානය දිනා ගැනීමට මොරටුව විශ්වවිද්‍යාලයට හැකිවිය. එනයින් මොරටුව විශ්වවිද්‍යාලයහි සිසුන් 2007 සිට අද දක්වා (2007, 2008, 2009, 2010 සහ 2011) වාර්ෂිකව පැවැත්වූ සෑම තරඟයකින්ම වැඩිම ප්‍රදානයන් ප්‍රමාණයක් දිනා ගත්හ. දෙවැනි ස්ථානයට පැමිණි විශ්වවිද්‍යාල වලින් දෙගුණයකටත් වඩා වැඩි ප්‍රදානයන් ප්‍රමාණයක් ලබා ගනිමින් 2005 සිට 2011 දක්වා මුලු ප්‍රදානයන් 136 ක් දිනා ගනිමින් ලොව ඉහළම විශ්වවිද්‍යාලය බවට පත්වෙමින් ශ්‍රී ලංකාව සඳහා මොරටුව විශ්වවිද්‍යාලයෙහි සිසුන් ඇ.ඩො 500,000 කට ඉහළ (රු මිලියන 50 කට වඩා) මුදලක් ඉපැයීය.

2011 දී USA හි විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවරුන්ගේ ආයතනය (IEEE) මගින් සංවිධානය කළ ලොව අතිශය තරඟකාරී ක්‍රමලේඛන තරගයක් ලෙස සැලකෙන IEEEXtreme ගෝලීය ක්‍රමලේඛන තරඟයේදී මොරටුව විශ්වවිද්‍යාලයේ කණ්ඩායම් දෙක රටවල් 65 ක කණ්ඩායම් 1515 ක් සමග තරඟවදිමින් අනුශූරයින් සහ 9 වන ස්ථානය බවට පත්විය. මොරටුවට ඉහළම 100 තුළ කණ්ඩායම් 10 ක් තිබුණා පමණක් නොව, ලොව කිසිදු විශ්වවිද්‍යාලයකට නොදෙවෙනි පරිදි ඉහළම 200 තුළ කණ්ඩයම් 30 ක් තිබිණි. මෙය 2009 වසරේ 40 කට අධික රටවල් තුළින් තරඟ කළ ලොවපුරා කණ්ඩායම් 721 අතුරින් විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍ය කණ්ඩායම **ප්‍රථම ස්ථානය ලබාගත් ජයග්‍රහනයේ සාර්ථකත්වයේ** ගොඩනැගීමයි. එය ලොව පුරා විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවරුන්ගේ ආයතන ශිෂ්‍ය ශාඛාවන් නිරූපණය කරන තිදෙනෙකුගෙන් යුත් ශිෂ්‍ය කණ්ඩායම් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවරුන්ගේ ආයතනය මගින් මතුකරන අභියෝගාත්මක ගැටළු කුලකයක් විසඳනු ලබන ගෝලීය පැය 24 මාර්ගගත තරඟයකි. මෙය මෙම ගෝලීය තරඟය ආසියා පැසිපික් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවරුන්ගේ ආයතනහි රටක් දිනාගත් ප්‍රථම අවස්ථාවයි. මෙම 2009 ජයග්‍රහණය හා 2010 හා 2011 පෙන්වූ දක්ෂතාවය අපගේ රටට, මොරටුව විශ්වවිද්‍යාලයට සහ ශ්‍රී ලංකාවේ ක්‍රමලේඛන කර්මාන්තයට විශාල පිළිගැනුමක් සහ කීර්තියක් ගෙනදුන් බැවින් මහත් වැදගත්කමක් දරයි.

2007, 2008 සහ 2009 වසර වලදී ලබාගත් ජයග්‍රහණ ඉදිරියට ගෙනයමින් 2011 Inexus ජාත්‍යන්තර රොබෝ තරඟයෙන්ද මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉදිරිපත් වූ ශිෂ්‍ය කණ්ඩායම රොබෝ තාක්ෂණ ක්ෂේත්‍රයෙන් 1 වන ස්ථානය දිනා ගත්හ.

ඊට අමතරව, ලෝක පැකේජ සංවිධානය මගින් සංවිධානය කළ ලෝක ශිෂ්‍ය තරුව පැකේජ, USA හි CFA වල දේශීය සංගමය මගින් පැවැත්වූ සහතිකලත් මූල්‍ය විශ්ලේෂක (CFA) තරඟය සේම ලෝක ව්‍යාප්ත ව්‍යාපාර අභියෝගතාව යන දේශීය හා කලාපීය තරඟවලින් මොරටුව විශ්වවිද්‍යාලය වෙතින් සහභාගි වූ ශිෂ්‍ය කණ්ඩායම් ජයග්‍රහණ ලබාගත්හ. තවද, තොරතුරු තාක්ෂණ පීඨයේ උපාධි අපේක්ෂකයින් 2005, 2006, 2007, 2008 වර්ෂ වලදී ලබාගත් ජයග්‍රහණ නොකඩවා ඉදිරියට ගෙනයමින් 2011 දී Microsoft Imagine Cup නැවත වරක් ජයග්‍රහණය කර තිබේ.

"ලෝකයේ හොඳම ප්‍රමාණ සමීක්ෂණ උපාධි පාඨමාලා අතුරින් එකක්" ලෙස එක්සත් ජනපදයෙහි වරලත් ප්‍රමාණ සමීක්ෂණයන්ගේ රාජකීය ආයතනයෙන් පැමිණි පරීක්ෂකවරුන් ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලාව නොකඩවා ඇගයීමට ලක් කළහ.

මොරටුව විශ්වවිද්‍යාලයෙහි ශික්ෂණයෙන් යුතු අධ්‍යයන ක්‍රියාකාරකම්, කර්මාන්ත කෙරෙහි නැඹුරු වූ පර්යේෂණ හා අන්තර්ක්‍රියා සහ එහි ජයග්‍රහණවල ප්‍රතිඵලයක් ලෙස කාර්මික පිරිස්, විශ්වවිද්‍යාල පද්ධතියෙහි අධ්‍යයන ප්‍රජාව සහ ශිෂ්‍යයින් අතර "ශ්‍රී ලංකාවේ හොඳම විශ්වවිද්‍යාලය" මොරටුව විශ්වවිද්‍යාලය ලෙස හැඟීමක් නිර්මාණය වී ඇත.

මෙය ඉංජිනේරු අධ්‍යයන වැඩසටහන් සඳහා ඇතුළත්වන නවක සිසුන් අතරද පවතින හැඟීමයි. මෑත කාලයේදී ඉංජිනේරු පීඨයට ඇතුළත් වූ සෑම ශිෂ්‍යයෙක්ම ඔවුන්ගේ පළමු කැමැත්ත ලෙස මොරටුව විශ්වවිද්‍යාලය ඉල්ලුම් කර තිබේ. 2011 නැඹුරුතාවය පවත්වාගෙන යමින්, කුසලතා ලැයිස්තුවේ ඉහළම සිසුන් 10% න් 98% කට වඩා වැඩි ශිෂ්‍යයන් පිරිසක් උපාධි අපේක්ෂක අධ්‍යයන සඳහා ඔවුන්ගේ පළමු කැමැත්ත ලෙස මොරටුව විශ්වවිද්‍යාලයෙහි ඉංජිනේරු පීඨය තෝරාගෙන ඇත. උසස් පෙළ විභාගයේ කුසලතා ලැයිස්තුවේ ඉහළම සිසුන් 10% කට පමණක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව මගින් ඔවුන්ගේ ස්වකැමැත්ත පරිදි විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබාදෙන නිසා මෙය සැලකිය යුතු කාර්යසාධනයකි.

5.2 ප්‍රධාන සැලැස්ම සහ සංයුක්ත සැලැස්ම

වාස්තුවිද්‍යා පීඨයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විත කණ්ඩායමක් 2020 සහ 2030 සඳහා මොරටුව විශ්වවිද්‍යාලයෙහි ප්‍රධාන භෞතික සැලැස්ම සංවර්ධනය කර තිබේ. මොරටුව විශ්වවිද්‍යාලයෙහි සියලුම වර්තමාන සංවර්ධන කටයුතු ප්‍රධාන භෞතික සැලැස්ම සමග සහ 2010 ඔක්තෝබර්වල සංශෝධනය කළ 2010-2015 සංයුක්ත සැලැස්ම සමග අනුකූලව කරගෙන යයි. 2010 ඔක්තෝබර් වලදී විශ්වවිද්‍යාල පාලක සභාව අනුමත කළ සංයුක්ත සැලැස්ම සියලුම පාර්ශවකරුවන් සමග පුළුල් සාකච්ඡාවකින් අනතුරුව සංවර්ධනය කර ඇත.

මොරටුව විශ්වවිද්‍යාල මූල්‍යමය බැදීම් එතරම්ම වැදගත් නොවන බොහෝ අරමුණු හා අභිමතාර්ථ ලඟාකරගෙන තිබෙන බව 2010-2015 සංයුක්ත සැලැස්මේ සමාලෝචනය පෙන්වාදෙන අතර ඉතිරියද ලඟා කරගැනීමේ මාර්ගයට මනාව පිවිසී ඇත. ඊට අමතරව, "මහින්ද චින්තන: නව ශ්‍රී ලංකාවක් සඳහා දැක්ම" සංකල්පය සමග අනුගතව 2020 සහ 2030 ප්‍රධාන භෞතික සැලසුම් සංවර්ධනය කර ඇත. ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) සහ වගකිවයුතු පාර්ශ්වයන් හඳුනාගනිමින් ප්‍රගතිය අධීක්ෂණයට සංයුක්ත සැලසුම් පාදක කරගෙන එක් එක් වර්ෂයේදී වසර දෙකේ ක්‍රියාකාරී සැලසුම් පිළියෙළ කෙරේ. 2011 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුම සමාලෝචනය යටතේ පවතී.

5.3 ප්‍රාග්ධන ආයෝජන.

පසුගිය වසර 5 තුළ ක්‍රියාත්මකවූ පහත සඳහන් ව්‍යාපෘතීන්ගෙන් බැහැරව 2011 දී තවත් ඉදිකිරීම් ව්‍යාපෘතීන් 2 ක් සම්පූර්ණ කිරීමට මොරටුව විශ්වවිද්‍යාලය භාග්‍යවත් විය.

ව්‍යාපෘතිය	වටිනාකම	තත්වය
1. තොරතුරු තාක්ෂණ පීඨය – පියවර 1	රු. මිලියන 315	2008 දී සමාප්තයි
2. යාන්ත්‍රික ඉංජිනේරු ගොඩනැගිල්ල	රු. මිලියන 130	2010 දී සමාප්තයි
3. රසායනික ඉංජිනේරු මධ්‍යස්ථානය	රු. මිලියන 99	2008 දී සමාප්තයි
4. පන්ති කාමර ගොඩනැගිල්ල – අදියර I	රු. මිලියන 47	2010 දී සමාප්තයි
5. පන්ති කාමර ගොඩනැගිල්ල – අදියර II	රු. මිලියන 96	2009 දී සමාප්තයි
6. සිවිල් ඉංජිනේරු පර්යේෂණ මධ්‍යස්ථානය	රු. මිලියන 132	2011 දී සමාප්තයි
7. වාස්තුවිද්‍යා පීඨය – පියවර I	රු. මිලියන 73	2011 දී සමාප්තයි
8. ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණ ගොඩනැගිල්ල	රු. මිලියන 148.2	කෙරෙමින් පවතින
9. දකුණු ආසියාතික ජල කළමනාකරණය පිළිබඳ මාදන්ජීට් සිං මධ්‍යස්ථානය (බාහිර අරමුදල්කරණය)	රු. මිලියන 50	කෙරෙමින් පවතින
10. රෙදිපිළි හා ඇඟළුම් දෙපාර්තමේන්තුව වෙත NE දිගුව	රු. මිලියන 83	කෙරෙමින් පවතින
11. පරිපාලන ගොඩනැගිල්ල	රු. මිලියන 282	කෙරෙමින් පවතින
12. කාන්තා නේවාසිකාගාරය	රු. මිලියන 194	කෙරෙමින් පවතින

2011 වසර තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් (UGC) ලද අරමුදල් වලින් ප්‍රාග්ධන ආයෝජනය ඉදිකිරීම් සඳහා රු මිලියන 82.5 ක්, ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සඳහා රු මිලියන 38 ක් හා ස්ථිර වත්කම් අත්පත් කරගැනීමට රු මිලියන 142 ක් විය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ලද වෙන්කිරීම් විශ්වවිද්‍යාලය සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගෙන ඇත. ඊට අමතරව, 2011 දී නව ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීමට අනෙකුත් මූලාශ්‍ර තුළින් එහි ජනනය වූ ආදායම සහ විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල හා දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදලෙහි රැස් වූ රු. මිලියන 31 ක් මොරටුව විශ්වවිද්‍යාලය විසින් අංක 380 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුකූලව ආයෝජනය කරන ලදී. තවද, ප්‍රාග්ධන වත්කම් සඳහා රු. මිලියන 16.6 ක පරිත්‍යාගයක්, පේෂකර්ම කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණ දෙපාර්තමේන්තුවේ උතුරු-නැගෙනහිර ගොඩනැගිල්ලේ දිගුව සඳහා රු. මිලියන 12.6 ක් සහ දකුණු ආසියා ජල කළමණාකරණ පුහුණුවීම් මධ්‍යස්ථානයේ ඉදිකිරීම සඳහා මදන්ජීට් සිං අරමුදලින් රු මිලියන 16 ක් විශ්වවිද්‍යාලයට ලැබිණි.

විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන (UDG), බාහිර උපාධි පාඨමාලා (EDP) සහ ගුණාත්මක හා නව්‍යතා ප්‍රදාන (QIG) සංරචක යටතේ ලෝක බැංකු අරමුදල්කරණ ව්‍යාපෘතියක් වන විසි එක්වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (HETC) මගින් අරමුදල් ලබා ගැනීමට මෙන්ම මානව සම්පත් සංවර්ධන සංරචකය යටතේ අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින් 8 දෙනෙක් හට දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල තුළ පශ්චාත් හා පර්යේෂණ පාදක කොටගත් විශාරද සුදුසුකම් සඳහා ශිෂ්‍යත්ව ලබා ගැනීමට මොරටුව විශ්වවිද්‍යාලය සාර්ථකවිය.

ක්‍රියාකාරකම් 4 ක්: ICT කුසලතා වැඩි දියුණු කිරීම, ඉංග්‍රීසි භාෂා කුසලතා වර්ධනය, මෘදු කුසලතා ශක්තිමත් කිරීම සහ ජනවාර්ගික ඒකාබද්ධතාව ප්‍රවර්ධනය යටතේ යෝජිත මැදිහත්වීම් කරගෙනයාම සඳහා විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන (UDG) හි 1 වන වටය යටතේ විශ්වවිද්‍යාලයට මිලියන 40ක්

ලැබිණි. ව්‍යාපෘතිය 2011 ජූලි මස ආරම්භ විය. සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගත් විසි එක්වන සියවස සඳහා උසස් අධ්‍යාපන (HETC) ව්‍යාපෘතිය යටතේ පොත්, ඉගැන්වීම් මෘදුකාංග සහ ඉලෙක්ට්‍රොනික සම්පත් මිලදී ගැනීමට රු. මිලියන 9.0 ක ප්‍රදානයක් ද විශ්වවිද්‍යාලය වෙත ලැබිණි.

ඊට අමතරව, ජේෂකර්ම සහ ඇඟළුම් දෙපාර්තුමේන්තුවේ උතුරු-නැගෙනහිර දිගුව ගොඩනැගීමේ ව්‍යාපෘතියට කාර්මික සංවර්ධන අමාත්‍යංශයෙන් රු. මිලියන 70 ක් ලැබිණි. පවත්නා පාෂාණ යාන්ත්‍රික විද්‍යාගාර ගොඩනැගිල්ල දකුණු ආසියා ජල කළමනාකරණය පිළිබඳ මදන්ජීට් සිං මධ්‍යස්ථානය ලෙස විශාල කරමින් දකුණු ආසියා ජල කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවීමට යුනෙස්කෝ තානාපති මදන්ජීට් සිංගෙන් රු. මිලියන 50 ක් ලැබිණි.

5.4 නවයකරණ සහ ව්‍යවසායක උපාධිධාරීන් බිහි කිරීම.

වර්ෂ තුනක් සඳහා වූ ගිවිසුමක් සමග ජාතික සංවර්ධන බැංකුවේ මූල්‍ය සහාය සමගින් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ එවැනි ප්‍රථම අවස්ථාවට 2010 දී මොරටුව විශ්වවිද්‍යාලය විසින් " ජාතික සංවර්ධන බැංකුව දායාද කළ ව්‍යවසායකත්වයේ මහාචාර්යවරයා/ සහකරුවා" නිර්මාණය කරන ලදී. මෙම මුලපිරීම යටතේ 2010 ඔක්තෝබර් මස ප්‍රථමයෙන් දායාද කළ මහාචාර්යවරයා පත්කෙරුණි.

මේ යටතේ මුල්පිරීම් වලින් එකක් ලෙස ශිෂ්‍යයින්ට ඔවුන්ගේ සාමාන්‍ය අධ්‍යාපනයේ නිරතවන අතරතුර නිර්මිත පරිසරයක් තුළ ජීවිතයට සැබෑ ව්‍යාපාර නිර්මාණය, අඛණ්ඩව කරගෙනයාම සහ අවසන් කිරීමේ ක්‍රියාපටිපාටි ඒ අයුරින්ම අනුගමනය කරමින් ඔවුන්ගේම ව්‍යාපාර නිර්මාණයට විශ්වවිද්‍යාලය පහසුකම් සපයයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ තරුණ ව්‍යවසායකයින් (YESL) ආයතනය මෙම වැඩසටහන සඳහා පහසුකම් සපයයි.

ඊට අමතරව, මොරටුව විශ්වවිද්‍යාලයෙහි BSc ඉංජිනේරු උපාධි විෂය මාලාවේ ව්‍යවසාය පිළිබඳ සුළු විශේෂණයක් සිසුන්ට අත්කර ගැනීමට තෝරාගත හැකි විෂයයන් ගණනාවක් ඇති බැවින් කැමැත්තක් දක්වන සිසුන්ට ව්‍යවසාය පිළිබඳ ඔවුන්ගේ දැනුම සහ කුසලතාව වර්ධනය කරගත හැක.

නවයකරණ උපාධිධාරීන් බිහිකිරීමේ තවත් මූලාරම්භයක් නම් ඇමරිකාවේ මැසචුසෙට්ස් තාක්ෂණ විද්‍යායතනය සමඟ මොරටුව විශ්වවිද්‍යාලය ආරම්භ කර ඇති ව්‍යාපෘතියයි. වර්ෂ 10 කට වඩා වැඩි කාලයක් අප්‍රිකාවේ දී තොරතුරු තාක්ෂණ නවයකරණය වේගවත් කිරීමේ (MIT-AITI) මොබයිල් තාක්ෂණ ස්ථානගත කිරීම් සහ ව්‍යවසායකත්ව වැඩසටහන සාර්ථකව පරීක්ෂා කොට මොරටුව විශ්වවිද්‍යාලය එවැනි ව්‍යාපෘතියක් ක්‍රියාවට නංවා ඇත. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ මොබයිල් තාක්ෂණ නවයතා හරහා උපාධි අපේක්ෂකයින් තුළට ව්‍යවසාය පිළිබඳ ආකල්ප සහ කුසලතා කාවැද්දීමයි. මෙම වැඩසටහන මොරටුව විශ්වවිද්‍යාලය තුල මොබයිල් ව්‍යවසායකත්වයෙහි මැසචුසෙට්ස් තාක්ෂණ විද්‍යායතනය විසින් පත්කළ තුන් දෙනෙක් විසින් සය මසක කාලපරිච්ඡේදයක් තුළ පූර්ණ කාලීන කඩිනම් පාඨමාලාවක් ලෙස පවත්වයි. සති හයක පාඨමාලා කාලය තුළ, ශිෂ්‍යයින් තාත්වික ආරම්භයක් ගොඩනැගීමට කඩිනම් පුහුණුවක් ලබන අතර ප්‍රදර්ශන දිනයේදී එම ශක්තිමත් ආරම්භයන් ඔවුන්ගේ ව්‍යාපාරයන් විභව්‍ය ආයෝජකයන් සමග සුසර කරයි. 2011 දී එවැනි සමාගම් හයක් දියත් කෙරිණි.

5.5 විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර් ක්‍රියාව

පශ්චාත් උපාධි පාඨමාලා, කෙටිකාලීන පාඨමාලා, පුහුණුවීම් සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු, උපදේශන සහ පරීක්ෂණ පැවරුම්, කර්මාන්ත අරමුදල්කරණය කළ පර්යේෂණ සහ සංවර්ධන විද්‍යාගාර, දෙපාර්තමේන්තු කර්මාන්ත උපදේශන මණ්ඩල, පීඨ කර්මාන්ත උපදේශන මණ්ඩල සහ ඒකාබද්ධ සමාජයීය වගකීම් ක්‍රියාකාරකම් හරහා මොරටුව විශ්වවිද්‍යාලය හට කර්මාන්තය හා සමාජය සමග කැපී පෙනෙන අන්තර් ක්‍රියාවක් ඇත. කාර්ය මණ්ඩල සාමාජිකයින්, සිසුන් සහ ආයතනය එක ලෙස එයින් ලබාදෙන ප්‍රතිලාභ නිසා කර්මාන්ත හා සමාජය සමග වූ මෙම අන්තර් ක්‍රියාවන් විශ්වවිද්‍යාලය දැඩිව දිරිමත් කරයි.

සන්නිවේදනය සඳහා වූ ඩයලොග් මොරටුව විශ්වවිද්‍යාල පර්යේෂණ විද්‍යාගාරය විදුලිසන්නිවේදනයෙහි කර්මාන්ත පදනම් වූ පර්යේෂණ හා නිෂ්පාදන සංවර්ධනය සඳහා ඉතාමත් සාර්ථක ආදර්ශයක් වී ඇත. ඩයලොග් මොරටුව විශ්වවිද්‍යාල පර්යේෂණ විද්‍යාගාරයේ සාර්ථකත්වය ඉලෙක්ට්‍රොනික ආශ්‍රිත නව තාක්ෂණයන් සඳහා වූ "Microsoft විද්‍යාගාරය", "Zone 24X7 මොරටුව විශ්වවිද්‍යාල පර්යේෂණ විද්‍යාගාරය" සහ ආහාර තාක්ෂණය සඳහා වූ "Cargils මොරටුව විශ්වවිද්‍යාල පර්යේෂණ විද්‍යාගාරය", රබර් සහ ලෙදර් නිෂ්පාදනවල නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය සඳහා වූ "DSI- මොරටුව විශ්වවිද්‍යාලය විද්‍යාගාරය" හි පිහිටුවීමට මග හෙළිකර ඇත. අනෙකුත් දෙපාර්තමේන්තු සඳහා එවැනිම පර්යේෂණ විද්‍යාගාර පිහිටුවීම සාකච්ඡා යටතේ පවතී.

කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, විලාසිතා පිළිබඳ ලන්ඩන් විශ්වවිද්‍යාල ආයතනය සහ මොරටුව විශ්වවිද්‍යාලය අතර සහයෝගීතාවයෙන් නිර්මාණවේදී උපාධි (මෝස්තර නිර්මාණය හා නිෂ්පාදන සංවර්ධනය) පාඨමාලාව මොරටුව විශ්වවිද්‍යාලයේ පිහිටුවනු ලැබීය. එහි සාර්ථකත්වය මත පදනම්ව, ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයට ප්‍රතිලාභ ලබාදෙන සහයෝගීත්ව ව්‍යාපෘති ගණනාවකට මොරටුව විශ්වවිද්‍යාලය හා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය ඇතුළත්ව තිබේ. උදාහරණ ලෙස කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, කර්මාන්ත සම්මේලනය හා මොරටුව විශ්වවිද්‍යාලය සහයෝගිත්වයන් හරහා ශ්‍රී ලංකාව තුළදීම ඉලෙක්ට්‍රොනික සහ විද්‍යුත් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඔවුන්ගේ මූලාදර්ශයන් නිෂ්පාදනයට හා පරික්ෂාවට සහාය වීමට රු. මිලියන 40 ක් වටිනා ශීඝ්‍ර මූලාදර්ශ (Rapid Prototyping) යන්ත්‍රයක්; ශ්‍රීලංකාව තුළ මුද්‍රා හා ආදර්ශ නිෂ්පාදකයින්ට අතිවිශාල වශයෙන් ප්‍රතිලාභ ලබාදෙන රු මිලියන 100 ක් වටිනා මුද්‍රා හා ආදර්ශ (Die and Mould) මධ්‍යස්ථානයක්; ත්‍රීරෝදරථ විද්‍යුතය මගින් ධාවනයට පෙරළීම; කොහු නිෂ්පාදනය උත්ශ්‍රේණිගත කිරීමේ ව්‍යාපෘති; ශීඝ්‍ර මූලාදර්ශී පහසුකම සඳහා තවදුරටත් සහාය වීම; බාරගෙන තිබේ.

කාර්ය මණ්ඩලය විසින් රජය, ප්‍රදාන නියෝජිතායතන සහ කර්මාන්තය වෙනුවෙන්, ජාතික සංවර්ධනයට අතිශය දායකත්වය සපයමින් මෙන්ම විශ්වවිද්‍යාලයේ ආදායම උත්පාදනයට දායක වෙමින් නව්‍යකරණ පරීක්ෂණ හා උපදේශන ව්‍යාපෘති බාරගැනීම නොකඩවා කරගෙන යයි. බොහෝ පාර්ශවකරුවන්ට එවැනි විශේෂිත සේවාවන් ලබාගැනීමෙහිදී මොරටුව විශ්වවිද්‍යාලයේ විශාල අපේක්ෂාවක් විය.

අභ්‍යන්තරිකව මෙම ක්‍රියා පටිපාටියට පහසුකම් සැපයීමට මොරටුව විශ්වවිද්‍යාලය විසින් ස්වයං මූල්‍යකරණය කළ විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියා ඒකකයක් (UIIC) පිහිටුවා තිබේ. ජාතික වශයෙන් වැදගත් නොයෙකුත් ව්‍යාපෘතීන් බාර ගැනීම සහ සාර්ථකව සම්පූර්ණ කිරීම ප්‍රතිඵලය වන විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් හා කර්මාන්තවල ප්‍රමුඛයන් අතර සබැඳියාවේ වටිනාකම දැනටමත් සනාථ කර තිබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සියලුම විශ්වවිද්‍යාල තුළ විශ්ව විද්‍යාල කර්මාන්ත ප්‍රජා අන්තර්ක්‍රියා ඒකක ස්ථාපනයට කිරීමට මොරටුව විශ්ව විද්‍යාලයේ අති සාර්ථක ස්වයං මූල්‍යකරණය කළ විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියා ඒකකයක (UIIC) ආදර්ශය භාවිතා කර තිබේ.

ඊට අමතරව, මොරටුව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් කර්මාන්ත අන්තර් ක්‍රියාව සඳහා විශ්වවිද්‍යාලයේ බාහිර හස්තයක් ලෙස ක්‍රියා කිරීමට සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ විශ්ව විද්‍යාල කාර්යය මණ්ඩල සාමාජිකයින්ගේ ලාභ නොලබන සංගමයක් වූ විශ්වවිද්‍යාල උපදේශන සේවා ආයතනයක් (UNIC) පිහිටුවා තිබේ.

විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියා ක්‍රියාකාරකම්වල නිරතවන අතරතුර, ඔවුන් රජයේ ඒකාබද්ධ අරමුදලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් කළ ප්‍රතිපාදන සඳහා වගවන බව සහතික කිරීමට සියලු කාර්ය මණ්ඩල සාමාජිකයින් උපාධි අපේක්ෂක ක්‍රියාකාරකම් සඳහා ඔවුන්ගේ නිශ්චිත ශාස්ත්‍රීය වැඩ නියමයන් සහ ශාස්ත්‍රීය භාරයන් සපුරාලන බවට සහතික කිරීම විශ්වවිද්‍යාල පාලක සභාවේ ප්‍රතිපත්තිය වේ. ඉහළ පුහුණුව හා උපාධිධාරීන්ගේ සුදුසුකම් උත්ශ්‍රේණිගත කිරීමට පිරිනමන පාඨමාලා; පුහුණු වැඩසටහන්; පුහුණුවීම් සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා; පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ දැනුම සහ තාක්ෂණය සංවර්ධනය හා හුවමාරුව සඳහා පවත්වන අනෙකුත් ශාස්ත්‍රීය පැවරුම්; කර්මාන්තය වෙත උපදේශන හා පරීක්ෂණ පැවරුම්; හා ඒකාබද්ධ සමාජයීය වගකීම් ක්‍රියාකාරකම් වැනි විශ්වවිද්‍යාලය මගින් කර්මාන්තය හා සමාජය වෙත සපයා දෙනු ලබන අනෙකුත් සියලුම සේවාවන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 380 ට අනුකූලව පිරිවැය ප්‍රතිසාධනය (ස්වයං මූල්‍යකරණය) මත පදනම් වේ. එයින් රජයට පිරිවැයක් නොමැතිවම මොරටුව විශ්වවිද්‍යාලය එහි සමාජමය හා කර්මාන්ත යුතුකම සම්පූර්ණ කරයි.

2011 දී එවැනි පිරිවැය ප්‍රතිසාධන (ස්වයං මූල්‍යකරණ) ක්‍රියාකාරකම් හා ව්‍යවසායක ක්‍රියාකාරකම් සඳහා කර්මාන්ත මුලපිරීම් හරහා රු. මිලියන 261 ක් මොරටුව විශ්ව විද්‍යාලය උත්පාදනය කළේය. උත්පාදනය කළ ආදායම රාජ්‍ය මුදල් චක්‍රලේඛ 380 ට අනුකූලව ලාභ රහිත පදනම යටතේ ප්‍රයෝජනයට ගන්නා ලදී.

5.6 තත්ව සහතික කිරීම

මොරටුව විශ්වවිද්‍යාලය සඳහා තත්ව සහතික කිරීමේ ප්‍රතිපත්තියක් විශ්වවිද්‍යාල පාලක සභාව මගින් අනුමත කර තිබේ. මොරටුව විශ්වවිද්‍යාලයෙහි තත්ව සහතික කිරීම, ශිෂ්‍යයින්, කාර්යය මණ්ඩලය, සේව්‍යයන් හා සමස්ත සමාජයට එහි සේවාවන් හා නිෂ්පාදනවල තත්වය සහතික කිරීමට, ඉගැන්වීම් යෙදවුම්, ඉගෙනුම් ප්‍රතිඵල, කාර්ය සාධන තක්සේරුව සහ විෂය බාහිර ක්‍රියාකාරකම්වල ප්‍රමිතිය පාරදෘශ්‍ය ආකාරයකින් කාර්යක්ෂමව සහ විශ්වාසදායීව තහවුරු කරන විශ්ව විද්‍යාලීය කළමනාකරණය තුළට කාවැද්දූ ක්‍රියාවලියකි.

තත්ව සහතික කිරීමේ උපාය මාර්ගය (QAS) මගින් අලංකාරෝක්තියට සත්‍යය සරිලන බව තහවුරු කරයි. එහි ආරම්භක ලක්ෂ්‍යය විශ්වවිද්‍යාල සංයුක්ත සැලැස්මෙහි දක්වා ඇති දෘෂ්ටිය හා මෙහෙවරයි. සංයුක්ත සැලැස්ම ක්‍රියාවට නැංවීමේදී, එහි සේවාවන් සහ නිෂ්පාදනවල තත්වය සහතික කිරීමට අවශ්‍ය පද්ධති සහ ක්‍රියාවලීන් විශ්ව විද්‍යාල කළමනාකරණය විසින් ස්ථාපනය කරයි. එමනිසා සංයුක්ත සැලැස්මේ නිරූපිත අරමුණු තත්ව ප්‍රතිපත්ති වලට පරිවර්තනය කිරීමෙන් තත්ව අරමුණු දහයකට ආසවනය කර තිබෙන අතර, ඒවා එක එකක් ප්‍රමුඛතාගත කළ ක්‍රියා මාර්ග වලට කොටස් කර තිබේ. එක් එක් ක්‍රියා මාර්ගයෙහි ප්‍රගතිය ඇති කිරීමට වගකියන නිලධාරියා/පාර්ශවකරුවා හඳුනාගෙන ඇත.

මොරටුවෙහිදී අගනා ප්‍රතිඵල ලබාදීමට හැකි එහි මූලික පාර්ශවකරුවන්, කාර්ය මණ්ඩලය සහ සිසුන් විශ්වවිද්‍යාලයට අවශ්‍ය අතර එහි අදහස තත්ව සහතික කිරීමේ උපාය මාර්ගය මගින් ලබාදෙයි. කීර්තිමත් විශ්වවිද්‍යාලක සංස්ථාපිත විශිෂ්ට ඉගැන්වීම් සහ ඉගෙනුමෙහි පැහැදිලි රුවක්ද එය පින්තාරු කරයි. ඉගැන්වීම් යෙදවුම් සහ ඉගෙනුම් ප්‍රතිඵල අත්කරගන්නා ස්ථානයේ අභ්‍යන්තර හා බාහිර

සන්දර්භය දෙස තත්ව සහතික කිරීමේ උපාය මාර්ගය බලන අතර ප්‍රමිතීන් ඉහළ නැංවීමට පීඨ මට්ටමින් නව යාන්ත්‍රණයන් විස්තර කරයි.

ශාස්ත්‍රීය හා පෞද්ගලික දියුණුව ශක්තිමත් කරගැනීමට තිබෙන ඉඩ ප්‍රස්තාවන්වලින් වාසි ලබා ගැනීමට සහ පුළුල් ලොවෙහි සාර්ථකත්වයට දායක වීමට ඔවුන්ට හැකි වීමට විවිධාකාර වූ පසුබිම්වල කාර්ය මණ්ඩල හා ශිෂ්‍යයින් තත්ව සහතික කිරීමේ උපාය මාර්ගය වෙත අවධානය යොමු කරයි. මෙයින් කොටසක් ඉගැන්වීම්වල ගුණාත්මක භාවය පිළිබඳ හා ආයතනය මගින් ඒ කෙරෙහි තබන වටිනාකම සම්බන්ධව වන අතර මේ සම්බන්ධව වෘත්තීය විශිෂ්ටත්වය සමග මොරටුව විශ්වවිද්‍යාලය තුල්‍යව පවතින බවට සහතික කිරීමට සැලසුම් කළ ක්‍රියාවන් තත්ව සහතික කිරීමේ උපාය මාර්ගය විසින් අන්තර්ගත කරයි.

තවදුරටත් ඉගැන්වීම් යෙදවුම්, ඉගනුම් ප්‍රතිඵල, කාර්ය සාධන ඇගයීම, පර්යේෂණ, ශිෂ්‍යත්ව සහ ව්‍යවසාය තත්ව සහතික කිරීමේ උපාය මාර්ගය මගින් ඌනපූරණයක් ලෙස සලකන අතර ඒවායෙහි අන්‍යොන්‍ය සම්බන්ධතාවය පිළිබඳ සුවිශේෂී දර්ශනයක් ස්ථාපනය කිරීමට උපකාරී වේ. තරගකාරීත්වය වැඩිවන පරිසරයක් තුළ, පුද්ගලයින්ට හා සමාජයට අවශ්‍ය දේ සැපයීමේ පීඩනය සහ ආයතනය එහි තරගකරුවන්ගෙන් වෙන්කර දැක්වීමට, මොරටුව විශ්වවිද්‍යාලයහි මෙහෙවරෙහි විවිධාකාර වෙළුම් නැවත ප්‍රකාශ කිරීමට තත්ව සහතික කිරීමේ උපාය මාර්ගය සහාය වේ. එය නිරතුරුව පෝෂණය කළ අගයන්ට බලපෑමකින් තොරව විශ්ව විද්‍යාලයට වෙනස සමග හොඳින් ගනුදෙනු කිරීමේ හැකියාව ලබාදෙයි.

විශ්වවිද්‍යාලයේ අරමුණු ඉෂ්ට කර ගැනීමට විශ්වවිද්‍යාලයේ සහ කාර්ය මණ්ඩලයේ ඵලදායීතාව ඉහල නැංවීමේ මාර්ග සහ විධි සාකච්ඡාව සඳහා 2006 මාර්තු සිට උපකුලපතිතුමාගේ සභාපතිත්වයෙන් විශ්ව විද්යාල නිලධාරීන් සහ වෘත්තීය සංගම් නියෝජිතයන් අතර මාසික 'පසුවිපරම' මාසික හමුව විශ්වවිද්‍යාලය මගින් පවත්වයි. ඊට අමතරව මාසය තුල සාකච්ඡා කිරීමට අවශ්‍ය සිසුන් සම්බන්ධ වැදගත් කරුණු කාරණා සකච්ඡාව කිරීමට උපකුලපතිතුමාගේ සභාපතිත්වයෙන් සියලුම ශිෂ්‍ය සංගම් වල කාරක සභික සාමාජිකයින් සහ විශ්ව විද්‍යාලයේ නිලධාරීන් අතර මාසික සම්බන්ධතා හමුවක් පැවැත් වේ. තවද පීඨ මට්ටමින් සියලුම ශිෂ්‍ය කරුණු සකච්ඡා කිරීමට සහ විසඳීමට පීඨාධිපතිතුමාගේ සභාපතිත්වයෙන් කාර්ය මණ්ඩල ශිෂ්‍ය මාසික සම්බන්ධතා හමුව සියලුම පීඨවල පැවැතිණි. මෙම සියලුම හමුවන් විශ්වවිද්‍යාලයීය වාර්ෂික දින දර්ශනයේ කොටසකි.

5.7 අවහිරතා

2010-2015 සංයුක්ත සැලැස්මේ 1-8 දක්වා අරමුණු වලින් බොහෝ අභිමතාර්ථ අර්ථාන්විතව මුදුන්පමුණුවාගෙන තිබේ. කෙසේ වුවද, අරමුදල් සඳහා මොරටුව විශ්වවිද්‍යාලය හට රජය මත රඳා පැවතීමට සිදුවන න ක්ෂේත්‍රයන්හි අරමුණු හා අභිමතාර්ථ සම්පූර්ණ වශයෙන් ඉෂ්ට කර ගැනීමට තවම නොහැකි වී ඇත. උදාහරණයක් ලෙස, 2011 දී පරිපාලන ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කලයුතු ලෙස සහ මොරටුව විශ්වවිද්‍යාලය වෙත ඇතුල් කර ගන්නා සිසුන් ප්‍රමාණය ඉහළ නැංවීමට කාන්තා සිසුන් 400 ක් සඳහා කාන්තා නේවාසිකාගාරයේ ඉදිකිරීම 2011 දී ආරම්භ කළ යුතු ලෙස 2010-2015 සංයුක්ත සැලැස්ම හඳුනා ගනියි. එලෙසම සැලකිය යුතු ලෙස තවත් ගොඩනැගිලි ගණනාවක ඉදි කිරීම් ප්‍රමාද වෙමින් ඇත. සැලසුම් කළ ලෙස සිසුන් ඇතුලත් කර ගැනීම ඉහළ නංවන ලද නමුත් අනුමත ව්‍යාපෘති වෙන්කළ සීමිත වූ අරමුදල් අවකාශයෙහි දැඩි අවහිරතා ඇති කර තිබේ. විශ්වවිද්‍යාලය මගින් පොරොන්දු වූ කොටස මොරටුව විශ්වවිද්‍යාලය විසින් සම්පූර්ණ කර ඇති නමුත් රජයේ මූල්‍යමය සීමා කිරීම් නිසා විශ්වවිද්‍යාලය හට ඔවුන්ගේ කොටස ඉටු කළ නොහැකි වූ අවස්ථාවන්ට උදාහරණ බොහෝය.

විශ්වවිද්‍යාලයක් "සාමාන්‍යයට වඩා බෙහෙවින් විවෘත" ස්ථානයක් විය යුතුය. අවාසනාවන්ත ලෙස, පුස්තකාලය, පරිගණක මධ්‍යස්ථාන හා විද්‍යාගාර වැනි ශිෂ්‍යයින් හා කාර්යය මණ්ඩලයට ඉතා වැදගත් සම්පත් දිනකට පැය 12 කට වඩා වසා දමා ඇත. මෙලෙස ඉතා වැදගත් සම්පත්/සේවාවන් ආවරණයට සහ යතුරු මුදාහැරීමට සේවා නියුක්තිකයන්ට පමණක් ඉඩ සැලසිය හැකි අතිකාල සීමා කිරීම් වැනි රාජ්‍ය අංශයේ පවතින මිනිස් බල නියාමන පාලනයන් නිසා එවැනි සම්පත් සහ පහසුකම් වලින් අර්ධයක් පමණක් අපි උපයෝජනය කරමින් සිටිමු. මේ අතර, දර්ශීයව අපි පැය 24 දින 7 විවෘත වූ විශ්වවිද්යාලයකට කැමැති වුවද, කෙටි කාලයක් තුළ යල් පනින පරිගණක සහ අනෙකුත් උපකරණ වැනි ප්‍රාග්ධන සම්පත් උපයෝජනය ඉහළ නැංවීමට අවම වශයෙන් සතියට දින 6 ක් එක් දිනකට පැය 16ක් (දවසින් තුනෙන් දෙකක්) විවෘතව තැබීමට හැකි එකකට අපි කැමැත්තෙමු. විශ්ව විද්‍යාලය, වර්තමාන මිනිස්බල නියාමන පාලනයන් මූලිකවම සැලසුම් කළ දර්ශීය රාජ්‍ය කාර්යාලයකින් වෙනස් වූ එක් ස්ථානයක් ලෙස හඳුනා ගන්නේනම් ශිෂ්‍යයින්, කාර්ය මණ්ඩලය සහ රජය අතිශයින් ප්‍රතිලාභ ලබනු ඇත.

වර්තමානයේ විශ්ව විද්‍යාලය තුළ ශිෂ්‍යයින්ගෙන් 19% කට පමණක් නේවාසිකාගාර ඉඩ පහසුකම් ලබා දී ඇත. 2007 දී නව නේවාසිකාගාර ව්‍යාපෘතියෙහි සමාප්තියත් සමග මෙම තත්වය යන්තම් වර්ධනය වුවද නේවාසිකාගාර ඉඩ පහසුකම් සැපයීම සැලකීමේදී මොරටුව විශ්වවිද්‍යාලය දිගටම අනෙකුත් විශ්ව විද්‍යාල වලට පිටුපසින් සිටියි. එමනිසා විශ්වවිද්‍යාලයට එහි ශිෂ්‍යයින් සඳහා නේවාසික පහසුකම් ප්‍රදානය ඉහළ නැංවීමට රජය වෙතින් අරමුදල් සෙවීම නොකඩවා කරගෙන යාමට සිදු වී ඇත.

මොරටුව, කටුබැද්දේ අක්කර 53 ක භූමි ප්‍රදේශයක විශ්වවිද්‍යාලය පිහිටා ඇත. භූමිය පිළිබඳ සැලකීමේදී වසර ගණනාවක් තිස්සේ කළ පුළුල් කිරීම් සමග භූමි ප්‍රදේශය සන්තෘප්ත ලක්ෂ්‍යයකට එළඹී ඇත. අවකාශ අවශ්‍යතා මැඩපැවැත්වීමට සිරස් පුළුල් කිරීමේ උපාය මාර්ගය විශ්වවිද්‍යාලය විසින් උත්සාහ කර ඇත. විශ්වවිද්‍යාලයකට යෝග්‍ය පරිසරයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවය සන්දර්භයෙන් ගත්කළ මෙම උපාය මාර්ගය සම්පූර්ණ විසඳුමක් සපයන්නේයැයි අපේක්ෂා කළ නොහැක.

වර්තමානයේ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණ ආයතනය (ITUM), එය හෝමාගම දියගම නැවත ස්ථාපනය කරන තෙක් පිහිටා ඇත. 2012 ජනවාරි මස මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණ ආයතනය (ITUM) නැවත පිහිටුවීමට ඇමරිකානු ඩොලර් මිලියන 89.5 ක සම්පූර්ණ ව්‍යාපෘති පැකේජයක් සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ චීන ජාතික ගුවන් තාක්ෂණ ආනයන හා අපනයන සංස්ථාව (CATIC) අතර වෙළඳ ගිවිසුමක් දැනටමත් අත්සන් කර ඇති නමුත් මුදල් අමාත්‍යාංශය සහ චීන අරමුදල් මූලාශ්‍රය අතර මූල්‍ය ගිවිසුම අත්සන් කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයක් පවතී. මෙම ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලය තුළ සාමකාමී පරිසරයකට පහසුකම් සලසනවා පමණක් නොව මොරටුව විශ්වවිද්‍යාලය හා මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණ ආයතනය යන දෙකෙහිම සීඝ්‍ර සංවර්ධනයට පහසුකම් සපයනු ඇත.

මෑත අතීතයේදී ප්‍රාග්ධන වියදම් සඳහා, විශේෂයෙන්ම උපකරණ සඳහා සැපයූ අරමුදල් අපේක්ෂිත මට්ටමට නොවූ බැවින් සැලකිය යුතු හිඟයක් නිර්මාණය විය. මෙම අඩුපාඩුව ජාත්‍යන්තර සහතිකකරණ කණ්ඩායම් හඳුනාගෙන තිබෙන අතර එය ලෝකයේ උසස් තත්වයේ විශ්වවිද්‍යාලයක් බවට පත්වීම උදෙසා ඉතා වැදගත් අවශ්‍යතාවයක් වන ජාත්‍යන්තර සහතික ලබා ගැනීම හෝ රඳවා ගැනීමේදී අභියෝගයක් බවට පත්ව ඇත. එලෙසම මෙය සංයුක්ත සැලැස්ම සමග සැසඳීමේදී විශ්ව විද්‍යාලයේ ප්‍රගතිය ප්‍රමාද කරන හේතුවක් වී තිබේ. කෙසේ වෙතත්, මොරටුව විශ්වවිද්‍යාලය සත්‍ය වශයෙන්ම ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් බවට ක්‍රමානුකූල පරිණාමය සඳහා 2011 දී ලබාදුන් රු. මිලියන 100 ක අතිරේක අරමුදල්කරණය විශ්වවිද්‍යාලය අගය කරයි.

නව්‍යකරණයට, තාක්ෂණ සංවර්ධනයට, වාණිජකරණයට සහ සීඝ්‍ර ආර්ථික වර්ධනය සඳහා උපාය මාර්ගයන් ලෙස ආරම්භයන් ප්‍රවර්ධනයට අනෙකුත් ජාත්‍යන්තර පිළිගත් විශ්වවිද්‍යාල ලෙස විශ්වවිද්‍යාල ආරක්ෂාගාර පිහිටුවීමට විශ්ව විද්‍යාලයට හැකිවිය යුතුය. අලාභ දරා ගැනීමට නොහැකි නිසා විශ්වවිද්‍යාලයන්හි ආරක්ෂාගාර(Incubators) පිහිටුවීමට නීතිමය වශයෙන් අවසර නැත. ආරක්ෂාගාර අවශ්‍යතා: බීජ අරමුදල් සහ සාර්ථකත්වයේ සහතිකයක් නොමැතිව සහාය වීම, හිමිකම සඳහා නීතිමය යාන්ත්‍රණය. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට පමණක් අවධානම දැරිය හැක. ඒ අයුරින්ම, එහි තමාගේම වාණිජකරණය කළ තාක්ෂණයන්හිම පාර්ශ්වකරුවකු බවට පත්වන පරිදි විශ්වවිද්‍යාල වලට ව්‍යාපාරයන්හි හවුල්කරුවන් විය නොහැක. කළ හැකි දෙය නම් තාක්ෂණවල සම්පූර්ණ විකිණීමේ අයිතිය හෝ එවැනි අනාවරණ සඳහා හිමිකාර භාරයක් ලබාගැනීමයි.

පර්යේෂණ හා සංවර්ධන වැඩ කරගෙන යාමට, විශේෂයෙන්ම සංවර්ධන දිශානත පර්යේෂණ හා සංවර්ධන වැඩ සඳහා විශ්වවිද්‍යාල දිරිමත් කෙරේ. කර්මාන්ත ගැටළු සඳහා එවැනි ඉලක්ක දිශානතියකින් යුතු පර්යේෂණ හා සංවර්ධන විසඳුම් සඳහා බොහෝ ඉල්ලීම් ඇත. කෙසේ වෙතත්, නිරන්තරවම ප්‍රමාදවීම් පිළිබඳව විශ්වවිද්‍යාල විවේචනයට ලක්වන අතර නියමිත කාලයට භාර දීමේ දුෂ්කරතාව නිසා සමහර අවස්ථා වලදී එවැනි ව්‍යාපෘති විශ්වවිද්‍යාල වලට නොදෙයි. හේතු වලින් එකක් වන්නේ බොහෝ කාලයක් ගන්නා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමේ අවශ්‍යතාවයයි. පර්යේෂණ ප්‍රසම්පාදනය සැලසුම් කළ නොහැකි අතර එබැවින් සීඝ්‍ර ප්‍රසම්පාදනයක් අවශ්‍යය. සාමාන්‍ය මාර්ගෝපදේශන උල්ලංඝනයේ ප්‍රතිඵලය බොහෝ විගණන ගැටලුය. බොහෝ රටවල පර්යේෂණ වැඩ සඳහා විශේෂ ප්‍රසම්පාදන මාර්ග තිබේ.

පසුගිය වසර ගණනාව තුළ මොරටුව විශ්වවිද්‍යාලය ලබාගත් කැපී පෙනෙන ජයග්‍රහණ රජය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව සැලකිල්ලට ගනු ඇතැයිද, සංයුක්ත සැලසුමේ අරමුණු හා අභිමතාර්ථයන් මුදුන්පමුණුවා ගැනීමට විශ්වවිද්‍යාලයට සහාය දක්වනු ඇතැයිද සහ එහි දැක්ම වූ **"වඩාත්ම ගෝලීයව පිළිගත් ආසියාවෙහි දැනුම් ව්‍යාවසාය වීම"** වටහා ගනු ඇතැයිද අවංකවම අපේක්ෂා කෙරේ.

මහාචාර්ය. ආනන්ද ජයවර්ධන
උපකුලපති
මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

6. සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

පීඨය	පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව*		මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව				මුලු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය **		මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව***	
				ස්ථිර		කොන්ත්‍රාත්තුමය					
		2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011
වාස්තු විද්‍යා පීඨය	AT [1]	333	341	55	53	10	14	20	19	50	48
	AD [2]	226	240								
	QS [3]	333	430								
	TCP [4]	238	236								
	FM [5]	207	258								
එකතුව		**1337**	**1505**	**55**	**53**	**10**	**14**	**20**	**19**	**50**	**48**
ඉංජිනේරු පීඨය	MPR [6]	2916	3004	200	207	30	35	112	111	217	226
	EM [7]	247	244								
	TM [8]	255	243								
	TLM [9]	257	254								
	FD [10]	156	198								
එකතුව		**3831**	**3943**	**200**	**207**	**30**	**35**	**112**	**111**	**217**	**226**
තොරතුරු තාක්ෂණ පීඨය	IT [11]	418	516	17	16	02	03	17	16	32	32
	ITM [12]	34	87								
එකතුව		**452**	**603**	**17**	**16**	**02**	**03**	**17**	**16**	**32**	**32**
වෙනත් අය (තොරතුරු තාක්ෂණය බල ගැන්වූ සේවා සඳහා වූ මධ්‍යස්ථානය, භෞතික අධ්‍යාපන ඒකකය)		-	-	-	-	-	-	07	06	-	-
මුළු එකතුව		**5620**	**6051**	**272**	**276**	**42**	**52**	**156**	**152**	**299**	**306**

සටහන්-

1 වාස්තුවිද්‍යාව
2 වාස්තු විද්‍යා නිර්මාණ
3 ප්‍රමාණ සමීක්ෂණය
4 නගර සහ ග්‍රාම සැලසුම් නිර්මාණය
5 පහසුකම් කලමනාකරණය
6 ඉංජිනේරු (මොරටුව, පේරාදෙණිය, රුහුණ)
7 භූසම්පත් ඉංජිනේරු විද්‍යාව
8 ඉංජිනේරු රෙදිපිළි සහ ඇඟළුම් තාක්ෂණය
9 ප්‍රවාහන සහ කාර්ය සම්පාදන කළමනාකරණය
10 මෝස්තර නිර්මාණය සහ නිපැයුම් සංවර්ධනය
11 තොරතුරු තාක්ෂණය
12තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය

* වර්ෂය ඇතුළත දෙන ලද ඕනෑම අවස්ථාවක ශිෂ්‍යයන් උපරිම සංඛ්‍යාව·

** ස්ථිර අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය· කොන්ත්‍රාත්තු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය සහ තාවකාලික උපදේශකයන්·

*** ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලය· කොන්ත්‍රාත් සහ තාවකාලික අනධ්‍යයන කාර්යමණ්ඩලය·

7. දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

(අ) ප්‍රථම උපාධි

පීඨය	පාඨමාලාව	මාධ්‍යය	ප්‍රවේශය (ශිෂ්‍ය සංඛ්‍යාව)		1 වන වසර සිසුන්		2 වන වසර සිසුන්		3 වන වසර සිසුන්		4 වන වසර සිසුන්		5 වන වසර සිසුන්		6 වන වසර සිසුන්		උපාධි ලත් සංඛ්‍යාව	
			2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011
වාස්තු විද්‍යා පීඨය	AT [1]	ඉංග්‍රීසි	55	55	26	23	57	61	56	57	56	56	56	56	31	37	49	40
	AD [2]	ඉංග්‍රීසි	50	50	21	21	50	49	49	50	41	49	18	20	-	-	29	01
	QS [3]	ඉංග්‍රීසි	100	100	39	40	96	93	93	96	51	93	23	25	-	-	53	50
	TCP[4]	ඉංග්‍රීසි	50	50	18	21	45	44	44	45	52	44	26	26	-	-	45	48
	FM [5]	ඉංග්‍රීසි	50	50	21	21	48	49	49	48	61	49	53	30	-	-	-	94
එකතුව			**305**	**305**	**125**	**126**	**296**	**296**	**291**	**296**	**261**	**291**	**176**	**157**	**31**	**37**	**176**	**233**
ඉංජිනේරු පීඨය	MPR[6]	ඉංග්‍රීසි	650	675	260	244	596	624	563	595	567	561	565	564	-	-	477	549
	EM [7]	ඉංග්‍රීසි	50	50	21	16	49	50	45	49	52	45	51	52	-	-	40	51
	TM [8]	ඉංග්‍රීසි	50	50	18	16	45	43	50	45	56	50	61	56	-	-	50	48
	TLM[9]	ඉංග්‍රීසි	50	50	25	21	51	50	48	51	56	48	52	56	-	-	-	50
	FD [10]	ඉංග්‍රීසි	40	40	21	18	42	42	33	42	40	33	43	16	-	-	39	02
එකතුව			**840**	**865**	**345**	**315**	**783**	**809**	**739**	**782**	**771**	**737**	**772**	**744**	**-**	**-**	**606**	**700**
තොරතුරු තාක්ෂණ පීඨය	IT [11]	ඉංග්‍රීසි	100	150	42	64	104	101	98	104	58	98	54	48	-	-	93	87
	ITM[12]	ඉංග්‍රීසි	50	50	14	22	-	34	-	-	-	-	-	-	-	-	-	-
එකතුව			**150**	**200**	**56**	**86**	**104**	**135**	**98**	**104**	**58**	**98**	**54**	**48**	**-**	**-**	**93**	**87**

සටහන්

1 වාස්තුවිද්‍යාව
2 වාස්තුවිද්‍යා නිර්මාණ
3 ප්‍රමාණ සමීක්ෂණය
4 නගර සහ ග්‍රාම සැලසුම් නිර්මාණය
5 පහසුකම් කළමනාකරණය
6 ඉංජිනේරු (මොරටුව, පේරාදෙණිය, රුහුණ)
7 භූසම්පත් ඉංජිනේරු විද්‍යාව
8 ඉංජිනේරු රෙදි පිළි සහ ඇඟළුම් තාක්ෂණය
9 ප්‍රවාහන සහ කාර්ය සම්පාදන කළමනාකරණය
10 මෝස්තර නිර්මාණය සහ නිපැයුම් සංවර්ධනය
11 තොරතුරු තාක්ෂණය
12 තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය

(ආ) පශ්චාත් උපාධි (පාඨමාලාව අනුව)

පීඨය	පාඨමාලාවේ නම	මාධ්‍යය	ප්‍රවේශය (ශිෂ්‍ය සංඛ්‍යාව)		අවසන් කළ සංඛ්‍යාව			
					විද්‍යාපති		පශ්චාත් උපාධි ඩිප්ලෝමා	
			2010	2011	2010	2011	2010	2011
වාස්තු විද්‍යා පීඨය	විද්‍යාපති/ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	53	25	20	03	-	02
	වාස්තුවිද්‍යාපති / වාස්තුවිද්‍යාව පිළිබඳ විද්‍යාපති	ඉංග්‍රීසි	-	-	04	03	-	-
	විද්‍යාපති/ නගර සැලසුම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	12	10	-	-	01	-
	විද්‍යාපති/ නගර සහ ග්‍රාම සැලසුම් නිර්මාණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	26	-	14	06	-	-
	විද්‍යාපති/ ACOMAS පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	-	-	-	01	02	-
	විද්‍යාපති/ භූදර්ශන සැලසුම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	-	-	-	06	-	-
ඉංජිනේරු පීඨය	විද්‍යාපති/ පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	38	36	06	17	01	-
	ව්‍යාපාර පරිපාලනවේදී/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	32	27	15	10	-	12

ඇදේ

පීඨය	පාඨමාලාවේ නම	මාධ්‍යය	ප්‍රවේශය (ශිෂ්‍ය සංඛ්‍යාව)		අවසන් කළ සංඛ්‍යාව			
					විද්‍යාපති		පශ්චාත් උපාධි ඩිප්ලෝමා	
			2010	2011	2010	2011	2010	2011
ඉංජිනේරු පීඨය	ව්‍යාපාර පරිපාලනවේදී / තාක්ෂණ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	46	43	30	37	-	-
	විද්‍යාපති / ව්‍යාපාර සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	15	20	-	-	-	-
	විද්‍යාපති / ද්‍රව්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	17	11	-	-	-	-
	විද්‍යාපති / ගොඩනැගිලි සේවා ඉංජිනේරු ශිල්පය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	33	-	-	-	-	-
	විද්‍යාපති / මෙහෙයුම් පර්යේෂණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	13	-	05	-	01	-
	ඉංජිනේරුපති/ අධිවේගී මාර්ග සහ වාහන ගමනාගමන ඉංජිනේරු ශිල්පය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	24	12	15	07	01	-
	විද්‍යාපති /ප්‍රවාහනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	03	04	07	-	-	-
	විද්‍යාපති / රෙදිපිළි සහ ඇඟළුම් තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	09	-	-	-	-	-

පීඨය	පාඨමාලාවේ නම	මාධ්‍යය	ප්‍රවේශය (ශිෂ්‍ය සංඛ්‍යාව)		අවසන් කළ සංඛ්‍යාව			
					විද්‍යාපති		පශ්චාත් උපාධි ඩිප්ලෝමා	
			2010	2011	2010	2011	2010	2011
ඉංජිනේරු පීඨය	ව්‍යාපාර පරිපාලනවේදී / ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	21	-	19	-	-	-
	විද්‍යාපති / විද්‍යුත් ඉංජිනේරු ශිල්පය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	61	46	17	12	-	-
	විද්‍යාපති / විද්‍යුත් ස්ථාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	16	31	07	15	-	-
	විද්‍යාපති / කාර්මික ස්වයංකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	21	13	11	08	-	-
	විද්‍යාපති /ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ ස්වයංකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ඉංග්‍රීසි	15	14	04	01	-	-
	විද්‍යාපති /පාරිසරික ඉංජිනේරු ශිල්පය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	29	05	01	-	01
	විද්‍යාපති /පාරිසරික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	04	01	01	-	-
	ව්‍යාපාර පරිපාලනවේදී /යටිතල පහසුකම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	-	04	-	01	-

ඇදේ

පීඨය	පාඨමාලාවේ නම	මාධ්‍යය	ප්‍රවේශය (ශිෂ්‍ය සංඛ්‍යාව)		අවසන් කළ සංඛ්‍යාව			
					විද්‍යාපති		පශ්චාත් උපාධි ඩිප්ලෝමා	
			2010	2011	2010	2011	2010	2011
ඉංජිනේරු පීඨය	ඉංජිනේරුපති./ ව්‍යුහ ඉංජිනේරු ශිල්පීය සැලසුම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	39	05	05	-	12
	විද්‍යාපති / ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	-	10	-	-	-
	ඉංජිනේරුපති./ ශක්ති තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	14	01	01	-	-
	විද්‍යාපති /මූල්‍ය ගණිතය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	21	21	01	03	-	-
	ඉංජිනේරුපති./නිෂ්පාදන පද්ධති ඉංජිනේරු ශිල්පය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	21	12	01	-	-
	විද්‍යාපති /විදුලිසන්නිවේදනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	26	06	05	01	-
	විද්‍යාපති / පොලිමර් තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	-	05	-	-	-
	ව්‍යාපාර පරිපාලනවේදී / ඊ-පාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	-	06	-	-	-

ඇදේ

පීඨය	පාඨමාලාවේ නම	මාධ්‍යය	ප්‍රවේශය (ශිෂ්‍ය සංඛ්‍යාව)		අවසන් කළ සංඛ්‍යාව			
					විද්‍යාපති		පශ්චාත් උපාධි ඩිප්ලෝමා	
			2010	2011	2010	2011	2010	2011
ඉංජිනේරු පීඨය	විද්‍යාපති / ඉලෙක්ට්‍රොනික විදුලිසන්නිවේදනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	-	-	-	01	-
	විද්‍යාපති /තිරසාර ක්‍රියාවලි සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	22	-	07	-	01
	විද්‍යාපති / ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	41	-	06	-	-
	Men/ පදනම් ඉංජිනේරු ශිල්පය සහ භූ ධාරණ පද්ධති පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	-	26	-	-	-	-
තොරතුරු තාක්ෂණ පීඨය	විද්‍යාපති / කෘත්‍රිම බුද්ධිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	11	14	09	05	-	-
	විද්‍යාපති /තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	35	-	03	24	01	01
එකතුව			**522**	**549**	**242**	**185**	**19**	**29**

සටහන : විද්‍යාපති සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා පිළිවෙළින් වසරක සහ වසර දෙකක සාමාන්‍ය කාලයක් ගත වේ.

(ඇ) පශ්චාත් උපාධි (පර්යේෂණ අනුව)

පීඨය	බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව						උපාධි ලත් ශිෂ්‍ය සංඛ්‍යාව					
	විද්‍යාපති		දර්ශනපති		ආචාර්ය		විද්‍යාපති		දර්ශනපති		ආචාර්ය	
	2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011
ගෘහනිර්මාණ ශිල්පය පිළිබඳ පීඨය	-	-	03	09	-	04	-	-	-	-	02	01
ඉංජිනේරු පීඨය	19	24	05	15	04	19	08	26	08	04	02	03
තොරතුරු තාක්ෂණ පීඨය	-	-	-	01	-	02	-	-	-	01	-	-
එකතුව	**19**	**24**	**08**	**25**	**04**	**25**	**08**	**26**	**08**	**05**	**04**	**04**

8. විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

පීඨය		පාඨමාලාව	මාධ්‍යය	ඇතුළත් කරගැනීම		1 වන වසර සිසුන්		2 වන වසර සිසුන්		3 වන වසර සිසුන්		4 වන වසර සිසුන්		උපාධි ලත් සංඛ්‍යාව	
				2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011
ඉංජිනේරු පීඨය	ශිෂ්‍යත්ව 100 වැඩසටහන යටතේ	ඉංජිනේරු විද්‍යාවේදී	ඉංග්‍රීසි	-	03	-	03	-	-	-	-	-	-	-	-
	විදේශීය සුදුසුකම් ලත් වෙනත් ශිෂ්‍යයන්	ඉංජිනේරු විද්‍යාවේදී (MPR)	ඉංග්‍රීසි	01	-	01	-	02	01	03	02	02	03	-	-
එකතුව				**01**	**03**	**01**	**03**	**02**	**01**	**03**	**02**	**02**	**03**	**-**	**-**

9. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

පීඨය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය		මහාචාර්ය		ආශ්‍රිත මහාචාර්ය		ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය		කථිකාචාර්ය (තාවකාලික)		කථිකාචාර්ය (පරිවාස)		කොන්ත්‍රාත් අධ්‍යයන කාර්ය මණ්ඩලය		උපදේශක	
	2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011	2010	2011
වාස්තුවිද්‍යාව	-	01	05	04	02	02	32	32	02	-	14	14	10	14	12	12
ඉංජිනේරු ශිල්පය	11	11	26	29	02	02	94	97	-	-	67	68	30	35	88	88
තොරතුරු තාක්ෂණය	-	-	01	01	-	-	07	07	-	-	09	08	03	02	07	05
එකතුව	**11**	**12**	**32**	**34**	**04**	**04**	**133**	**136**	**02**	**-**	**90**	**90**	**43**	**51**	**107**	**105**

පුස්තකාලය	පුස්තකාලයාධිපති		ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති 11 ශ්‍රේණිය		සහකාර පුස්තකාලයාධිපති 11 ශ්‍රේණිය	
	2010	2011	2010	2011	2010	2011
පුස්තකාල කාර්ය මණ්ඩලය*	01	01	03	03	03	03
එකතුව	**01**	**01**	**03**	**03**	**03**	**03**

iii) සමාලෝචිත වර්ෂය තුල උපාධි අපේක්ෂකයින් 861 කට හා උපාධි අපේක්ෂිකාවෝ 247 කට නේවාසිකාගාර පහසුකම් සලසා තිබූණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල මහපොළ ශිෂ්‍යත්ව ආධාර වශයෙන් ශිෂ්‍යයින් 2484 කට රු.10,310,400 ක් ගෙවා තිබූ අතර ශිෂ්‍යාධාර වශයෙන් ශිෂ්‍යයින් 805 කට රු.4,945,300 ක් ගෙවා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1995 ජූලි 14 දිනැති හා අංක 636 දරන චක්‍රලේඛය අනුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විභාගයන් පවත්වා මාස 03 ක් ඇතුලත ප්‍රතිඵල නිකුත් කළයුතු වුවද, 2010 වර්ෂයේ සහ 2011 වර්ෂවලදී පැවැත්වූ විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීම මාස 04 සහ මාස 08 ක කාල පරාසයක් තුල ප්‍රමාද වූ අවස්ථා 10 ක් නිරීක්ෂණය විය.

(ඈ) එක් උපාධි පාඨමාලාවක පළමු අර්ධ වර්ෂයේ (1st Semester) ප්‍රතිඵල නිකුත් කිරීමට ගතකර ඇති කාලය, එම පාඨමාලාවට අදාල සිසුන්ගේ දෙවන අර්ධ වර්ෂයේ (2nd Semester) විභාගය පැවැත්වූ දිනයෙන් පසු දිනයක් දක්වාම ප්‍රමාද වී පැවතුණි.

4.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) මොරටුව විශ්වවිද්‍යාලයට අයත් අංක 52 - 1943 දරන වාහනය 2010 අප්‍රේල් 29 වැනි දින අනතුරකට භාජනය වී තිබුණු අතර වාහනය අළුත්වැඩියා කිරීමකින් තොරව 2012 මැයි 08 දිනටද විශ්වවිද්‍යාල භූමියේ ගාල්කර තිබේ. මෙම වාහනය අනතුරකට භාජනය වීම නිසා විශ්වවිද්‍යාලයට සිදුවූ අලාභය අදාල රක්ෂණ ආයතනයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) ඇතැම් ආචාර්යවරුන් ලබාගෙන ඇති පර්යේෂණ අවසන් කළයුතු දිනය ඉකුත් වී තිබියදී එම පරීක්ෂණය සම්පූර්ණ කිරීමට ප්‍රථමව නැවත නව පර්යේෂණ වෙනුවෙන් සනාතන පර්යේෂණ කමිටුව අනුමැතිය ලබාදී තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) සනාතන පර්යේෂණ කමිටුව මගින් නිර්දේශ කර රු. 26,379,050 ක මුදල් වෙන් කරන ලද පර්යේෂණ 88 ක අවසන් කළයුතු කාලය ඉකුත් වී තිබුණද අදාල පර්යේෂණ මේ දක්වා අවසන් කර නොතිබුණි.

(ඇ) දේපලක අයිතිය වෙනස් වී සති 08 ක් ඇතුලත පළාත් පාලන ආයතනයට දැනුම් දී නව අයිතිය ලේඛනගත කරවා ගැනීමට කටයුතු කලයුතු වුවත්, එසේ නොමැතිව දේපල හයක් සඳහා පෙර අයිතිකරුගේ නමින් වරිපනම් බදු මුදල් ගෙවා තිබුණි.

(ඉ) යෝජිත බහුකාර්ය ශ්‍රවනාගාර ව්‍යාපෘතියේ උපදේශක සේවා ගාස්තු වන රු.1,273,329 ක් පෞද්ගලික ආයතනයට 2005 වර්ෂයේදි ගෙවා එම වියදම කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගතකර තිබූ අතර එම ව්‍යාපෘතියේ කටයුතු මේ දක්වා ආරම්භ කර නොතිබුණි.

4.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අරමුදල් ගිණුම් 09 කට අදාල රු.1,330,165 ක ශේෂයක් 2011 වර්ෂයේ අක්‍රියව පැවතුණි.

(ආ) ආසියානු සංවර්ධන බැංකු ශිෂ්‍යත්ව අරමුදල් ගිණුම් රු.938,701 ක ශේෂය 2007 වසරේ සිට අක්‍රියව පැවතුණි.

4.4 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

මොරටුව විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති ඩීසල් ජෙනරේටරයට අදාල ඉන්ධන ටැංකියට නල මගින් ඉන්ධන සැපයීම සඳහා ලීටර් 12500 ක භූගත ඉන්ධන ටැංකියක්ද ස්ථාපිත කිරීම වෙනුවෙන් දරා තිබූ වියදම රු.1,481,400 කි . මෙම ඉන්ධන ටැංකිය ස්ථාපනය කර වසර 3 ක් ආසන්න වී ඇතත් මේ දක්වා එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2010 - 2015 සංයුක්ත සැලැස්ම අනුව 2011 වර්ෂයේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වූ පශ්චාත් උපාධි පාඨමාලා 03 ක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

5.2 **වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2012 මැයි 31 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5.3 **අයවැය පාලනය**

ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් රු.4,000,000 ක මුදලක් වාර්ෂික අයවැය මගින් ඇස්තමේන්තු කර ඇතත්, සමාලෝචිත වර්ෂයේ එම ව්‍යාපෘති දෙක සඳහා වියදම් දරා නොතිබුණු අතර, අයවැයගත ආදායම් වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින් වර උපකුලපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුයි.

(අ) පශ්චාත් උපාධි පාඨමාලා ආදායම්
(ආ) ණය අයකිරීම
(ඇ) ගිවිසුම් කඩකිරීම්
(ඈ) පර්යේෂණ
(ඉ) මූල්‍ය පාලනය
(ඊ) ලෙජර පැවැත්වීම
(උ) ජ' නල් සටහන්
(ඌ) උපයෝගී ලේඛණ

(එච්.ඒ.එස්.සමරවීර)
විගණකාධිපති

මොරටුව විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය හා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(7)(ඒ)වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු –නීති සහ රෙගුලාසි යොමුව	විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ
2. මූල්‍ය ප්‍රකාශණ	
2.1 තත්වාගණනය කළ මතය	
මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශණ වලින් 2011 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.	
2.2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස් දැක්වීම	
2.2.1 උසස් ගිණුම්කරණ පරිචයන් අනුගමනය නොකිරීම	

මූල්‍ය ප්‍රකාශණවල අයිතමයන්ගේ ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කල විටක වුවද, සංසන්ධනාත්මක අගයන් යළි වර්ගීකරණය කළ යුතුය. ස්වයං ඉපයීම් පාඨමාලා ලැබීම් හා ගෙවීම් වල අනුරූපී සංඛ්‍යා මූල්‍ය ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුනි.	ස්වයං ඉපයීම් පාඨමාලා ලාබීම් හා ගෙවීම් මූල්‍ය ප්‍රකාශණ වල හෙළිදරව් කිරීම 2011 වර්ෂයේ අවසන් ගිණුම් වලින් ආරම්භ කරන ලද හෙයින් 2010 වර්ෂය අනුරූපී සංඛ්‍යාවක් දැක්වීම සිදුවී නොමැත. 2011 වර්ෂයේ ගිණුම් ප්‍රකාශන වල මෙම සටහනට අදාලව හැර සියලුම සටහන්වල අනුරූපී සංඛ්‍යාවක් දැක්වීම සිදුකර ඇත.
2.2.2 ගිණුම් කරන අඩුපාඩු	
(අ)අවසන් වී තිබූ කෙටිකාලීන පාඨමාලා 17 ක්,ව්‍යාපෘති 05 ක් හා වෙනත් පාඨමාලා 10 කට අදාලව රු. 5,822,421 ක අතිරික්තය ඒ ඒ වර්ෂවල ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට විලම්භිත ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	(අ) <u>කෙටිකාලීන පාඨමාලා</u> විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන කෙටිකාලීන පාඨමාලා වලින් එක් වාරයකින් පමණක් අවසන් නොවන කාලීනව වාර්ෂිකව/අර්ධ වාර්ෂිකව ආදී වශයෙන් පවත්වනු ලබන පාඨමාලා හැර අනිකුත් පාඨමාලා එම කටයුතු අවසන් වු පසු ගිණුම් පියවීමට කටයුතු යොදා ඇත. තවද එසේ පවත්වාගෙන යනු ලබන ගිණුම් වර්ෂ 03 ක කාලයක් අක්‍රියව පැවතියේ නම් එම පාඨමාලා සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශ ලබාගෙන ගිණුම් වසා දැමීමට කටයුතු කරනු ලැබේ. 2011 වර්ෂයේදී අදාල පරිදි කටයුතු කර ඇති අතර දක්වා ඇති ගිණුම් ශේෂයන්ද ඉදිරියේදී වාර්ෂිකවද ගිණුම් පියවීමට කටයුතු කරනු ලැබේ. <u>ව්‍යාපෘති ගිණුම්</u> විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ව්‍යාපෘති සම්බන්ධ ගිණුම් එම ව්‍යාපෘති අවසන් වු පසු පියවීමට කටයුතු යොදා ඇත. තවද එසේ පවත්වාගෙන යනු ලබන ගිණුම් වර්ෂ 03 ක කාලයක් අක්‍රියව පැවතියේ නම් එම ව්‍යාපෘති සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශ

ලබාගෙන ගිණුම් වසා දැමීමට කටයුතු කරනු ලැබේ. 2011 වර්ෂයේදී අදාල පරිදි කටයුතු කර ඇති අතර දක්වා ඇති ගිණුම් සම්බන්ධ පාඨමාලා සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශ නොලැබීම නිසා පියවීමට නොහැකිවී ඇත. ව්‍යපෘති සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශ ලැබුන පසු දක්වා ඇති ගිණුම් ශේෂයන්ද ඉදිරියේදී වාර්ෂිකවද ගිණුම් පියවීමට කටයුතු කරනු ලැබේ.

වෙනත් පාඨමාලා

1 OA-ZI-97 · South Asian Games – 2006- Rowing event-ගිණුමට අදාල මුදල් යොදවා මෙම ක්‍රීඩා ඉසව්වට අවශ්‍ය උපකරණ මිළදී ගැනීමට කටයුතු යොදා ඇත

2 OA-ZI-46 - Aptitude test for Archi/QS & BD

මෙම ගිණුම් ශේෂය අදාල යෝග්‍යතා පරීක්ෂණ රාජකාරි වෙනුවෙන් ගෙවීමට රඳවා ගත් මුදලක් වන අතර ගෙවීම් වවුචර මෙතෙක් නොලැබීම නිසා රඳවා ගත යුතුව ඇත.

3 **OA-ZI – 94**- Mentoring Programme /Civil Engineering

OA-ZK-15- Mentoring Programme /Earth Resource Eng.,

OA-ZK-18 -Career Mentoring Programme /IT Faculty,

OA-ZK-21 –Mentoring Programme /Chem & Process Eng

වෙනත් පාඨමාලා වලට අදළ ඉහත ගිණුම් 04 පවත්වාගෙන යනුයේ ශිෂ්‍යයන් වෙනුවෙන් පවත්වනු ලබන උපදේශන පාඨමාලාවලට අදලව

	හෙයින්ද, එම උපදේශන පාඨමාලා කාලීනව සිදුකරනු ලබන බැවින්ද එම ශේෂයන් ඉදිරියට ගෙන යනු ලැබේ. 4 **OA-ZI-11- ITRU Symposium** මෙම ITRU ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය (Symposium) කාලීනව සිදුකරන බැවින් එම ශේෂයන් ඉදිරියට ගෙන යනු ලැබේ. 5 **OA-TD – 08** -Survival Craft Course, **OA-ZE-15** - Intermediate Pro. For Pattern Makers, **OA-ZH-01**-Painting Conservation Fellowships විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ඉහත සඳහන් වෙනත් පාඨමාලා 30 සම්බන්ධ ගිණුම් පාඨමාලා සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශ මෙතෙක් නොලැබීම නිසා පියවීමට නොහැකිවී ඇත. ව්‍යාපෘති සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශ ලැබුන පසු දක්වා ඇති ගිණුම් ශේෂයන්ද ඉදිරියේදී වාර්ෂිකවද ගිණුම් පියවීමට කටයුතු කරනුලැබේ.
(ආ) අධ්‍යයන කටයුතු අවසන්ව තිබූ අවුරුදු 03 ක හා අවුරුදු 02 ක පශ්චාත්උපාධි පාඨමාලා 2011 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 04 කට අදල රු.2,373,162 ක් වූ අතිරික්තය ආදායම් ලෙස ගිණුම්ගත කළයුතු වුවද,එය විලම්භිත ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.	(ආ) <u>පශ්චාත් උපාධි පාඨමාලා</u> මෙම පශ්චාත් උපාධි පාඨමාලා වලට අදල ගිණුම් 04 එක් එක් දෙපාර්තමේන්තු වෙනුවෙන් පවත්වනු ලබන පශ්චාත් පර්යේෂණ උපාධි ගිණුම්වේ. මෙම ගිණුම් ශේෂ ඉදිරියේදි ඇතිවන අවශ්‍යතාවයන් වෙනුවෙන් පවත්වාගන යාමට සිදුවන අතර දක්වා ඇති ශේෂ ආදායමට ගැනීමට හැකියාවක් නොමැත.
(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට පොත් අගය ශූන්‍ය වන නමුත් ප්‍රයෝජනයට ගනු ලබන පිරිවැය රු. 9,957,738 ක් වූ වත්කම්	(ඇ) ප්‍රථම වරට විශ්වවිද්‍යාලයේ වත්කම් ප්‍රත්‍යාගනනය කිරීම 1991 වර්ෂයේදී සිදුකර ඇති අතර ඉන්පසු වත්කම් ප්‍රත්‍යාගනනයක් සිදුකර

ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.	නොමැත. ඒ අනුව ඔබ විසින් උපලේඛනයේ දක්වා ඇති වත්කම් ඇතුළු සියළු වත්කම් ඉදිරි කාලය තුලදී ප්‍රත්‍යාගනනය කිරීමට කටයුතු යොදන බව දන්වමි.
(ඇ) ස්ථාවර තැන්පතු 02 ක් වෙනුවෙන් 2011 වර්ෂයට අදාල ලැබිය යුතු පොලී රු. 1,608,082 ක් ගිණුම්ගත කර නොතිබු බැවින් ආයෝජනය පොලී ආදායම් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.	(ඇ) දක්වා ඇති 2011 වර්ෂයට අදාල ආයෝජන පොලිය විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇති අතර එම පොලී ප්‍රමානයන් 2012.01.03 දිනැති අංක 133811 සහ 133812 දරණ ලදුපත් මගින් ආදායමටගෙන ඇත. ප්‍රමාද දෝෂයකින් 2011 වර්ෂයන් ආයෝජන පොලි ලෙස ගිණුම් ගතවී නොමැති අතර ජර්නල් අංක 2012 - J /341 මගින් අදාල ගැලපීම් කිරීමට කටයුතු කර ඇත.
(ඉ) ඉකුත් වර්ෂවල උපචිත වියදම් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේදී එම ගිණුමෙන් රු. 18,217,538 ක් පොදු සංචිත ගිණුමට මාරුකිරීමට සිදුවී තිබුණි.	(ඉ) ඉදිරියේදී උපචිත වියදම් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම් අවම කිරීම සඳහා අදාල අංශ දැනුවත් කිරීමට කටයුතු කර ඇත.
(ඊ) සේවක පාරිතෝෂික ප්‍රතිපාදන සැලසීමේදී නිලධාරියාගේ මුළු සේවා කාලය හා අවසන් මාසයේදී ලැබු වැටුප පදනම් කරගෙන වගකීම ගණනය කලයුතු වුවත් විශ්වවිද්‍යාලය විසින් කාර්ය මණ්ඩල නිලධාරියාගේ මුළු සේවා කාලය නොසලකා 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂ වලට අදාල වගකීම වු රු. 75,197,238 ක් පමණක් ප්‍රතිපාදනය කිරීම නිසා සේවක පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමේ ඌණ ප්‍රතිපාදන සලසා තිබුණි.	(ඊ) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය විශ්‍රාම යන අවස්ථාවේදී ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීමට අදාල පාරිතෝෂික වෙන්කිරීම 2006 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර ඉන් පසු ඊට පසුගිය වර්ෂ 10 කට අදාලව වන පාරිතෝෂික ගණනය කර ගිණුම් ගත කර ඇත. එසේ වුවද සියළුම කාර්ය මණ්ඩලයේ සේවා කාලය හා දැනට ලබන වැටුප පදනම් කරගෙන පාරිතෝෂික ගණනය කර ගිණුම් ගත කිරීම සඳහා ප්‍රමානවත් ප්‍රතිපාදන නොමැතිවීම නිසා වාර්ෂිකව වෙන් කරනු ලබන ප්‍රතිපාදන ගිණුම් ගත කර ඇත. එසේ වුවද ඉදිරියේදී නව පාරිතෝෂික ගණනය කිරීමේ ක්‍රමවේදය අනුව පාරිතෝෂික දීමනා

	ගණනය කර අදාල ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ. **තවද ඔබ වාර්තාවෙහි දක්වා ඇති "2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂවලට අදාල වගකීමවූ රු 75,197,238 ක් පමණක් ප්‍රතිපාදනය කිරීම නිසා" යන්න නිවරදි නොවන බවද දන්වමි.**
(උ)මොරටුව විශ්වවිද්‍යාලය විසින් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් 02 කට අදාලව 2011 දෙසැම්බර්31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනයේ දක්වා තිබෙන බැංකුව විසින් කරන ලද සෘජු හර කිරීම් රු.49,465 ක් සහ සෘජු බැර කිරීම් රු. 146,282.50 ක් හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේ ගිණුම් වලට ගලපා නොතිබුණි.	(උ) අදාල බැංකු ජංගම ගිණුම් 02 කට අදාලව සෘජු හර කිරීම් වලින් රු 41,865.00ක් සහ සෘජු බැර කිරීම් වලින් රු 39,955.00ක් දැනට හඳුනාගෙන ගිණුම් ගතකර ඇත. ඉතිරි සෘජු හර කිරීම රු 8,800.00 සහ සෘජු බැර කිරීම් රු 106,327.50 සම්බන්ධව තොරතුරු බැංකුව වෙතින් ලැබුණු පසු නිවැරදි ගිණුම්වලට මාරුකිරීම කරනු ලැබේ. **තවද වාර්ෂිකව මෙම ගිණුම් හරහා ලංකාවේ සියලුම බැංකු ශාඛා මගින් සිදුකරන විශාල ගනුදෙනු ප්‍රමාණය අනුව මෙම ගනුදෙනු සංඛ්‍යාව සහ වටිනාකම 0.01% ක් පමන වන බවද දන්වමි.**
(ඌ) 2011 දෙසැම්බර් මාසය සඳහා පිරිසිදු කිරීමේ සේවා සඳහා ගෙවිය යුතු රු. 198,991 ක වියදම් ගිණුම්ගත කර නොතිබුණි.	(ඌ) 2012 ජනවාරි මස සිට විශ්වවිද්‍යාලයේ වැඩ ඉංජිනේරු විශ්‍රාම පූර්ව නිවාඩු යෑම හේතුවෙන් ඇතිවූ පුරප්පාඩුවට වෙනත් සුදුසු අයෙක් පත් කරන තෙක් තාවකාලිකව පත්කල නිලධාරිනියට අදාල තොරතුරු නොලැබීම නිසා මෙම ප්‍රමාදය සිදුව ඇත. ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇතිවීම වැලැක්වීමට අවශ්‍ය පියවරයන් ගැනීමට උපදෙස් දී ඇත.

එ) උපදේශක සේවා සංචිත අරමුදල් ගිණුමේ ශේෂය රු.52,979,548ක් වුවද ඊට අනුරූපීව පවත්වාගෙන යනු ලබන ආයෝජන ගිණුමේ පැවති රු.6,115,630 ක් හා බැංකු ජංගම ගිණුමේ පැවති රු.47,155,960ක් වශයෙන් එහි එකතුව ලෙස රු.53,271,590 ක් වූ බැවින් සංචිත ගිණුම හා ආයෝජන ගිණුම අතර රු. 292,042 ක වෙනසක් නිරීක්ෂණය විය.	(එ) 2012 - J /310 ජර්නලය මගින් ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
(ඒ) මුල්‍ය ප්‍රකාශන වල වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එන ලද රු.1,350,000ක් වූ හඳුනානොගත් හර ශේෂයක් සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු විගණන ගාස්තු ලෙස ගිණුම්ගත කරතිබුණි.	(ඒ) මෙම ශේෂය වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන අ ශේෂයක් වන අතර අදාල ගිණුම විශ්ලේෂණය කර නිවරදි කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඔ) 2009/2010 අධ්‍යයන වර්ෂය සඳහා මහපොළ ශිෂ්‍යයත්ව ආධාර ලෙස ශිෂ්‍යයින් වෙත ගෙවන ලද රු.3,543,500ක මුදල මහපොළ ශිෂ්‍යත්ව අරමුදල විසින් ප්‍රතිපූර්ණය කිරීමේදී මහපොළ අත්තිකාරම් ලැබිය යුතු ආදායම් ගිණුමට බැර නොකර පොදු සංචිත ගිණුමට බැර කර තිබුණි.	(ඔ) 2012 - J /219 ජර්නලය මගින් නිවරදි කර ඇත.
(ඕ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත්කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව 2010 වර්ෂයට අදල සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් හා ජංගම බැරකම් වැඩිවීම සහ ශේෂ පත්‍රයේ දක්වා ඇති ජංගම වත්කම් හා ජංගම බැරකම් වැඩිවීම අතර රු.510,527 ක වෙනසක් නිරීක්ෂණය විය.	(ඕ) නිවරදි කිරීමට කටයුතු කර ඇත

(ක) අබලි භාණ්ඩ විකිණීමෙන් ලද මුදල වන රු.695,163.00ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් ලෙස ආදායම් වියදම් ගිණුමේ දක්වා තිබියදීත් එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වු ආදායමක් ලෙස දක්වා තිබුණි.	(ක) නිවරදි කිරීමට කටයුතු කර ඇත
2.2.3 **ලැබිය යුතු ගිණුම්**	
(අ) සේවය හැරගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවියයුතු වර්ෂ 05කට වැඩි කාලයක් කල්ඉකුත්ව ඇති වාරික අයවීමකින් තොරව පවතින රු.500,685ක ණය ශේෂයන් 2011 දෙසැම්බර් මස වනවිටත් අයකරගෙන නොතිබුණි.	(අ) රු 479,079.00 ක් අදාල පුද්ගලයිනගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම් වලින් අයකර ගැනීමට සටහන් කර ඇත. රු.890.00 ක් අදාල පුද්ගලයින්ගේ නීතිමය කටයුතු අවසන් වන තෙක් අයකර ගැනීමට හැකියාවක් නොමැත. රු.37,270.00 ක් අර්ථසාධක අරමුදලින් අයකිරීමට කටයුතු කර ඇත
(ආ) විවෘත විශ්වවිද්‍යාලයට ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් 2010 වර්ෂයේ සිට අයවිය යුතුව ඇති රු.20,716 ක් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	(ආ) මෙම රු.20,716.00 ක මුදල ප්‍රතිපූර්ණය කරන ලෙස විවෘත විශ්වවිද්‍යාලයට දන්වා යවා ඇත.
(ඇ) සේවකයින් 21 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 04 කට වැඩි කාලයක් කල්ඉකුත්ව ඇති රු.94,590කණය ශේෂයන් 2011 දෙසැම්බර් මස වනවිටත් අයකරගෙන නොතිබුණි.	(ඇ) වෙනත් විශ්වවිද්‍යාල වලින් අයවිය යුතු මෙම මුදල ප්‍රතිපූර්ණය කරන ලෙස අදාල විශ්වවිද්‍යාලයන්ට දන්වා යවා ඇත.
(ඈ) 1. මොරටුව විශ්වවිද්‍යාලයේ ගෘහස්ත ක්‍රීඩාපිටිය ඉදිරිකිරීම වෙනුවෙන් වර්ෂ 05 කට පෙර සිට ක්‍රිඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතුව තිබු රු.4,435,700 ක් අයකරගෙන නොතිබුණි.	(ඈ) 1. මෙම මුදල ප්‍රතිපූර්ණ කරන ලෙස ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත කිහිප විටක් දැනුම් දී ඇත. එසේ වුවද මෙතෙක් කිසිදු යහපත් ප්‍රතිචාරයක් එම දෙපාර්තමේන්තුවෙන් ලැබී නොමැත.

	තවදුරටත් මෙම මුදල අයකර ගැනීමට උත්සාහ දරනු ලබන අතර විශ්වවිද්‍යාල විගණන හා කළමණාකරන කමිටුවේ තීරණයක් අනුව මේ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගැනීම සදහා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් සමග සාකච්ඡාවක් සදහා ඉල්ලීමක්ද කර ඇත.
(ඇ) 2. ගෘහස්ත ක්‍රීඩාගාර ව්‍යාපෘතියට අදල කෙරියෙන යන වැඩවල වටිනාකම ලෙස රු.1,000,000 ක් 2005 වර්ෂයේ සිට අඛණ්ඩව ඉදිරියට ගෙන තිබුණි.	(ඇ) 2. ඉහත (ඇ) 1 අනුව මෙම ව්‍යාපෘතියට අදල ගනුදෙනු අවසන් නොවීම නිසා මෙම ගිනුම් පියවා නොමැත. එසේ වුවද 2012 වර්ෂයේදී මෙම ගිනුම් පියවීමට කටයුතු කරනු ලැබේ.
(ඉ) <u>ගිවිසුම්ගත බැදුම්කර අයකරගැනීම</u> 2011 දෙසැම්බර් 31 දිනට ගිවිසුම් හා බැදුම්කර කඩකර තිබු නිලධාරීන් 25 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 32,525,793 ක් වු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්‍ෂණය විය. 1 ඉහත නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු මුදලින් රු.502,544 ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට අදල නිලධාරීන් විසින් අනුමැතිය දී තිබුණද 2011 දෙසැම්බර් 31 වන විටත් එම මුදල් අයකරගෙන නොතිබුණි. 2 ගිවිසුම් කඩකිරීමෙන් වසර 10 කට වැඩි කාලයක් ගතකරතිබු නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු ගිවිසුම් හා බැදුම්කර වන්දි වටිනාකම වන රු.10,188,920 ක් මේ දක්වා අයකරගෙන නොතිබුණි. 3 3 ගිවිසුම් හා බැදුම්කර කඩකර තිබු නිලධාරීන් 07දෙනෙකු ගෙන් අයවිය යුතු රු.7,439,692 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් නිතිමය ක්‍රියාමාර්ග ගැනීමට මේ දක්වා සිදුකර නොතිබුණි.	(ඉ) 2011 වර්ෂය තුල ගිවිසුම් හා බැඳුම්කර කඩකර තිබු ආචාර්යවරුන් 17දෙනෙකුගෙන් රු.7,043,377.13ක මුදලක් අයකරගන ඇති අතර එය විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන ලද අයකර ගැනීම් පිළිබඳ සක්‍රිය ක්‍රියාවලියේ සාර්ථක ප්‍රතිඵලයක් බව දන්වමි. එයට අමතරව ලේඛණයේ දක්වා ඇති ගිවිසුම් හා බැඳුම්කර අයකර ගැනීමට ඇති ආචාර්යවරුන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග පහත දක්වමි. i. හතර දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,984,963.00ක් අදල පුද්ගලයින්ගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කර ඇත. ii. දසදෙනෙකුගෙන් අයවිය යුතු රු.12,670,816ක මුදලක් අයකර ගැනිම සදහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඒ වෙනුවෙන් විශ්වවිද්‍යාලය නිරන්තර අවධානයෙන් කටයුතු කරමින් පවතී.

	iii. එක් අයෙකුගෙන් අයවිය යුතු රු.82,384.00 ක් අයකර ගැනීම සදහා ලැබිය යුතු දිවුරුම් ප්‍රකාශය ලබානොදීම නිසා අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට නොහැකිව පවතින බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් දන්වා ඇත. iv. එක් අයෙකු දැනට ඕස්ට්‍රේලියාවේ පදිංචි වී සිටින අතර,නීතිමය ක්‍රියාමාර්ග ගත නොහැකි බව නීතිපති දෙපාර්තමේන්තුව දන්වා ඇති බැවින් ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් කාර්යාලය හරහා මෙම අයකර ගැනීම සිදුකිරීමට කටයුතු යොදා ඇත. අයවිය යුතු මුදල රු.1,927,200.00 කි. v. දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.827,824.00 ක මුදලින් රු. 539,829.69 ක් අයකරගෙන ඇති අතර ඉතිරි රු. 287994.31 ක් අදාල අයගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. vi. එක් අයෙකු රු.1,203,733.00 ක මුදලින් කොටස් වශයෙන් විශ්වවිද්‍යාලයට ගෙවනු ලබන අතර 2011 වර්ෂය තුළ රු.420,000.00 ක් ගෙවා ඇත. vii. එක් අයකුගෙන් අයවිය යුතු රු.1,177,940.00 ක් අයකර ගැනීමට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් මෙතෙක් අයකර ගැනීමට නොහැකි වී ඇත. viii. එක් අයකුගෙන් අයවිය යුතු රු.118,905.00 ක මුළු මුදලම අයකර ගැනීමට කැමැත්ත ප්‍රකාශ කල ලිපිය ඉදිරිපත් කිරීමට නොහැකිවීම නිසා අයකිරීම ප්‍රමාද වී ඇත.

	ix. එක් අයකුගෙන් අයවිය යුතු රු.140,370.00 ක් අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා ඇත. x. එක් අයකුගෙන් අයවිය යුතු රු.3,180,812.00ක් අයකර ගැනීමට නීතිමය කටයුතු සඳහා පුද්ගලයා හෝ ඇපකරුවන් පිළිබඳ වර්තමාන නිවැරදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කර ඇත. xi. එක් අයකුගෙන් අයවිය යුතු රු.8,823,812.00 ක මුදල ලබා ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත නොහැකි බව නීතිපති දෙපාර්තමේන්තුව දැනුම් දී ඇත. පුද්ගලයා සම්බන්ධව කිසිදු තොරතුරක් සොයා ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව ගිවිසුම් හා බැඳුම්කර අයකර ගැනීමට **විශ්වවිද්‍යාලයට ගතහැකි උපරිම උත්සාහයන් ගෙන ඇති බවද දන්වමි.**
(ඊ) වර්ෂ කිහිපයක සිට ඉදිරියට එන පුස්තකාල දඩමුදල් රු.139,461 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාද අයකරගෙන නොතිබුණි.	(ඊ) මෙම අයවිය යුතු පුස්තකාල දඩ මුදල් වලින් අයකරගෙන ඇති ප්‍රමාණය ගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ.
2.2.4 **ගෙවිය යුතු ගිණුම්**	
(අ) ජාතික විද්‍යා පදනම මගින් අනුග්‍රහය දැක්වුපර්යේෂණයට අදාලව ලැබු රු.111,236 ක ශේෂය වර්ෂ 06 ක සිට ඉදිරියට එන අතර එය නිරවුල් කිරීමට කටයුතු කරනොතිබුණි.	(අ) මෙම ව්‍යාපෘතිය අවසන් බවට ව්‍යාපෘති සම්බන්ධීකාරකවරයාගෙන් වාර්තා ලැබී නොමැති බැවින් ගිණුම් පියවීමට නොහැකි වි ඇත. අදාල වාර්තා ලැබුනු පසු ගිණුම් පියවීමට කටයුතු කරනු ලැබේ.
(ආ) වෙනත් ආයතන මගින් අනුග්‍රහය දක්වා ඇති පර්යේෂණ 04ක් වෙනුවෙන් ලැබු මුදල් රු. 814,608 ක ශේෂයන් වර්ෂ 04 ක කාලයක	(ආ) වෙනත් ආයතන මගින් අනුග්‍රහය දක්වා ඇති පසුගිය වර්ෂවල ක්‍රියාත්මක නොවු ව්‍යාපෘති 04 ක් මෙතෙක් අවසන් බව ව්‍යාපෘති

සිට ඉදිරියට එන අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	සම්බන්ධීකාරකවරුන් දැනුම් දී නොමැත. ඒ අනුව අදාල තහවුරු කිරීම් ලැබෙන තෙක් ගිණුම් පියවීමට නොහැකි අතර අදාල වාර්තා ලැබුනු පසු ගිණුම් පියවීමට කටයුතු කරනු ලැබේ.
2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව අනුකූල නොවීම	
(අ) (1) උසස් අධ්‍යාපන ආයතන සඳහා වු ආයතන සංග්‍රහය x පරිච්ඡේදයේ 23 වගන්තිය	
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වු ආයතන සංග්‍රහය පරිච්ඡේදයේ 23 වගන්තිය ප්‍රකාරව ආචාර්යවරුන්ට දෙනු ලබන නිවාඩු පිළිබඳ නිවාඩු ලේඛන පවත්වා නොතිබුණි.	ආචාර්යවරුන් විසින් ලබාගන්නා නිවාඩු වෙනම ලේඛනයක නොව එක් එක් ආචාර්යවරුන්ගේ පෞද්ගලික ලිපිගොනුවල සහ අදාල නිවාඩු ලේඛනවල (උදා වෛද්‍ය නිවාඩු, ප්‍රසූත නිවාඩු) පවත්වාගන යනු ලැබේ. අධ්‍යයන නිවාඩු සහ සප්තවාර්ෂික නිවාඩු විස්තර මාසිකව යාවත්කාලීන වන ආකාරයට පරිඝණකගත ලේඛනයක් පවත්වාගන යනු ලැබේ. මෙම වාර්තාමාසික නිවාඩු සහ ප්‍රධාන කමිටුවට (**Leave & Awards Committee)** ඉදිරිපත් කරනු ලැබේ.
(11.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අංක 856 හා 2005 ජනවාරි 31 දිනැති චක්‍රලේඛයේ 6.3 සහ 6.4 ඡේදය	
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අංක 856 හා 2005 ජනවාරි 31 දිනැති චක්‍රලේඛයේ 6.3 සහ 6.4 ඡේදය අනුව මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් කමිටුවක් පත්කළ යුතු බවත් මාසිකව ප්‍රගති වාර්තා විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යැවිය යුතු යැයි නියම කර ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	අදාල කමිටුව දැනට ක්‍රියාත්මක වන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 856 අනුව කටයුතු කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 1 මු.රෙ.396 මොරටුව විශ්වවිද්‍යාලය විසින් පවත්වා තිබු බැංකු ගිණුම් 02 කට අදාලව නිකුත් කල නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකල මාස06 ඉක්මවා තිබු චෙක්පත් 31 වටිනාකම රු.705,322 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි	(අ)1. අදාල චෙක්පත්වල කාලය දීර්ඝ කර තිබීම නිසා අවලංගු කර ආදායමට ගැනීමට කටයුතු කර නොමැත. එසේ වුවද තවදුරටත් චෙක්පත් ඉදිරිපත් නොකරන්නේ නම් ඒවා අවලංගු කර ආදායමට ගැනීමට කටයුතු කරනු ලබන බවද දන්වමි.
11 මු.රෙ.570 සහ 571 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලය තුළ ලබාගෙන ඇති ටෙන්ඩර් තැන්පතු වටිනාකම වන රු. 472,954ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	(අ)11. දක්වා ඇති පසුගිය වර්ෂවලට අදාල ටෙන්ඩර් තැන්පත් ශේෂයන් අපසු ලබා ගැනීම සඳහා තැන්පත්කරුවන් මෙතෙක් ඉල්ලීම් කර නොමැති අතර මේ සම්බන්ධයෙන් මුදල් කමිටුවට වාර්ථා කර ආදායමට ගැනීමට කටයුතු කරනු ලබන බවද දන්වමි.
2.2.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවු ගණුදෙනු	
(අ) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා දායක මුදල් ගෙවීමේදී අධ්‍යයන දීමනාව සැළකිල්ලට නොගතයුතු බව අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක බීඩී/අයිඑන්එස්/සීඑල්යුඑස්-ඒ/078 හා 2003 ජුලි 18 දිනැති ලිපියෙන් දන්වා තිබියදීත් රට පටහැනිව එම දීමනාව සඳහා ද දායක මුදල් ගෙවීම නිසා 2011 වර්ෂයේදී විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට හා විශ්‍රාම වැටුප් දායක මුදලට රු. 943,746 ක් සහසේවක භාර අරමුදලට රු. 188,749 ක් වශයෙන් වැඩිපුර දායක මුදල් ගෙවා නොතිබුණි.	(අ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2011.04.28 දිනැති අංක 955 චක්‍රලේඛය අනුව අධ්‍යයන දීමනාව මත අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීම නතර කර ඇත. විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය වෙනුවෙන් කරනු ලබන සියලු ගෙවීම් සිදුකිරිම,අත්හිටුවීම හෝ නතර කිරීම ආදිය සිදුකරනු ලබනුයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව වන අතර, විශ්වවිද්‍යාලයන් එම නිකුත් කරනු ලබන චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීමට බැදී සිටී.
(අ) අංක පීඊ/1/174/11(බී) හා 1998 මාර්තු 10 දිනැති රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව භාෂා දීමනාව ගෙවීම රාජ්‍ය	(අ) ආයතන චක්‍රලේඛ ලිපි 39/90,34/91,6/97 සහ 10/2001 අනුව සහ 14/1996 සහ 24/97 දරණ ආයතන චක්‍රලේඛ ලිපි අනුව

සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අදල නොවන බව සඳහන් වන නමුත් එයට පටහැනිව 2011 වර්ෂය තුල භාෂා දීමනා වශයෙන් රු. 908,816 ක් සේවකයින්ට ගෙවා තිබුණි	විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය සඳහා භාෂා ප්‍රවීණතා දීමනාව ගෙවීම් කරන ලදී. ඉන්පසු භාණ්ඩාගාරයේ පොදු ව්‍යපාර දෙපාර්තරම්න්තුවේ, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහ විගණකාධිපතිගේ පැහැදිලි කිරීම් සළකා බලා නිකුත් කර ඇති 2010.06.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන චක්‍රලේඛ ලිපි අංක 06/2003 අනුව 2003.01.01 දිනට පෙර සේවය කරන ලද කාර්ය මණ්ඩලය සඳහා මෙම දීමනාව ගෙවනු ලබන අතර එම දීමනාව චක්‍රලේඛ ප්‍රකාරව නිත්‍යානුකූල ගෙවීමක් බව දන්වමි. විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය වෙනුවෙන් කරනු ලබන සියලු ගෙවීම් සිදුකිරීම, අත්හිටුවීම හෝ නතර කිරීම ආදිය සිදුකරනු ලබනුයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව වන අතර විශ්වවිද්‍යාලයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී.
(ඇ) මුදල් අමාත්‍යංශයේ ලේකම්ගේ අංක පීඊ1/174/12003 හා 2003 ජනවාරි 29 දිනැති ලිපියෙන් දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු නමුත් ඉන් බැහැරව මුදල් චක්‍රලේඛ අංක 380 යොදු ගනිමින් 2011 වර්ෂය තුළදී පශ්චාත් උපාධි පාඨමාලා ආදයමින් රු. 2,483,421 ක් සහ කෙටිකාලීන පාඨමාලා ආදයමින් රු. 5,403,139 ක මුදලක් එම කටයුතුවලට සෘජු ලෙස දයක වු බව තහවුරු නොවු සේවකයින්ට දීමනා ලෙස ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් 2000 ඔක්තෝම්බර් 04 දිනැති අංක පීඑප/එජ්එස්/18	(ඇ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 29 (ඇ) වගන්තිය අනුව විශ්වවිද්‍යාල බලතල යටතේ විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධි පාඨමාලා පවත්වනු ලබන ආකාරය තිරණය කිරීම විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන ආකාරයට සිදුවිය යුතු බව දැක්වේ. ඒ අනුව මොරටුව විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් පශ්චාත් උපාධි පාඨමාලා / කෙටිකාලීන පාඨමාලා පැවැත්වීම / ගාස්තු අයකිරීම සහ එම ආදයම වියදම් බෙදී යන ආකාරය තීරණය කිරීම ඇතුළු සියළු කාර්යයන් සම්බන්ධව ගතයුතු ක්‍රියාවලියක් / ක්‍රමවේදයක්,එම පාඨමාලා ක්‍රියාත්මක

දරණ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල්ගේ ලිපිය අනුව විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කටයුතු වලින් බාහිර වු සේවා වලට පමණක් අංක 380 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය අදාල වන බවත්, පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කටයුත්තක් බැවින් අංක 380 දරණ චක්‍රලේඛයේ විධිවිධාන පශ්චාත් උපාධි පාඨමාලා ආදායම් සඳහා බල නොපාන බව පෙන්වා දී තිබුණි.	කිරීමේදී ඇතිවන ප්‍රායෝගික කරුණු සලකා බලා අනුමත කර ඇත. ඒ අනුව එම අනුමත ක්‍රමවේදය මත විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙතද මෙම ගෙවීම් සිදුකර ඇත. තවද විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි/කෙටිකාලීන පාඨමාලා වලින් අනුමත ක්‍රමවේදය අනුව විශ්වවිද්‍යාල අරමුදල සඳහා ලැබිය යුතු ප්‍රදානයන් විශ්වවිද්‍යාලයේ අරමුදල් වශයෙන් පවත්වාගෙන යනු ලබන අතර එම මුදල් විශ්වවිද්‍යාලයේ පීඨයේ / දෙපාර්තමේන්තු/පාඨමාලාවල සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනේ. විශේෂයෙන් විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය උපාධි පාඨමාලා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපකරණ ආදිය රජයේප්‍රතිපාදන වලින් පමණක් සපයා ගැනීම අපහසු හෙයින් ඒවා මිළදී ගැනීමට මෙම අරමුදල් යොදා ගනු ලැබේ. පසුගිය වර්ෂ 05 ක කාලයක් තුල මෙම ආදායම් වලින් රුපියල් මිලියන 257 ක් පමන මුලධන වියදම් සහ වෙනත් සංවර්ධන කටයුතු වලට යොදා ගෙන ඇත.
3.මූල්‍ය සමාලෝචනය **3.1 මූල්‍ය ප්‍රතිඵල** ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු වලින් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 906,178,865 ක ඌනතාවයක් වු අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු. 812,635,204 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු. 874,066,000 ක් වු	3.1 සියලුම වියදම් (ක්ෂය සහ ක්‍රමක්ෂය ඇතුලුව) ගණන් ගැනීමෙන් පසු 2012 වර්ෂයට අදාල ඌනතාවය 2011 වර්ෂය අනුව සැසඳීමේදී රු මිලියන 7 කින් පමණ අඩුවී ඇත. 2011 වර්ෂයට අදාල රජයේ ප්‍රදාන සහ වෙනත් ආදායම් ක්ෂය සහ ක්‍රමක්ෂය ගැලපීමට පෙර වියදම් සමග මෙහෙයුම් ප්‍රතිඵලය පහත පරිදි වේ.

රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා වූ ඌනතාවය රු.32,112,865 ක් දක්වා අඩුවී තිබුණ අතර, ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා ලැබුනු රු. 773,200,000 ක් යු රජයේ ප්‍රදාන ගනන් ගැනීමෙන් පසුව එම වර්ෂය ඌණතාවය රු. 39,435,204 ක් දක්වා අඩුවී තිබුණි.	රු ක්‍රමක්ෂය ගැලපීමට පෙර රජයේ ප්‍රදාන සහ වෙනත් ආදායම් 1,140,777,142 **එකතුකලා**-2011 වර්ෂයට හිණුම් ගත නොවූ පොලී ආදායම් 1,608,082 2011 වර්ෂයට ගලපන ලද ආදායම් **1,142,385,224** ක්ෂය ගැලපීමට පෙර වියදම් 1,142,412,321 **එකතුකලා** - 2011 වර්ෂයට හිණම් ගත නොවූ වියදම් 198,991 2011 වර්ෂයට ගලපන ලද **1,142,611,312** 2011 වර්ෂයට ගලපන ලද මෙහෙයුම් ප්‍රතිඵලය **(226,088)** ආදායමේ ප්‍රතිශතයක් ලෙස **0.02 %**
3.2 මුල්‍ය කළමනාකරණ අකාර්යක්ෂමතා	
උපදේශන සේවා සංචිත අරමුදලේ වූ රු.24,289,080 ක් ජංගම ගිණුමක රඳවා තිබූ අතර එම මුදල් ආයෝජනය කර පොලී ආදායමක් උපයා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.	එදිනෙදා කටයුතු ප්‍රමාදයන්ගෙන් තොරව පවත්වාගෙන යාමට මාස දෙකකට පමණ ප්‍රමාණවත් මුදල් රඳවාගෙන ඉතිරිය ස්ථාවර මුදල් තැන්පතු සහ ඉතුරුම් තැන්පතුවල ආයෝජනය කර ඇත. කෙසේ වුවද ඉදිරියේදී ගිණුම ශේෂයන් අවම මට්ටමක තබාගෙන ඉතිරි මුදල් ආයෝජනය කිරීමට කටයුතු යොදා ඇත.

<table>
<tr><td>4. මෙහෙයුම් සමාලෝචනය</td><td></td></tr>
<tr><td>4.1 කාර්යසාධනය</td><td></td></tr>
<tr><td>(අ) සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍ය තොරතුරු පහත පරිදි විය.</td><td></td></tr>
<tr><td>
<table>
<tr><th></th><th>වාස්තුවිද්‍යා පීඨය</th><th>ඉංජිනේරු පීඨය</th><th>තොරතුරු තාක්ෂණ පීඨය</th></tr>
<tr><td>බඳවාගත් උපාධි අපේක්ෂක සංඛ්‍යාව</td><td>84</td><td>208</td><td>305</td></tr>
<tr><td>පිටවූ උපාධි අපේක්ෂක සංඛ්‍යාව</td><td>703</td><td>76</td><td>216</td></tr>
<tr><td>රැඳී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව</td><td>3170</td><td>515</td><td>1244</td></tr>
</table>
i සමාලෝචිත වර්ෂයේ සේවයේ නියුක්තව සිටි ස්ථිර කථිකාචාර්යවරු සංඛ්‍යාව 224 ක් වූ අතර එක් කථිකාචාර්යවරයෙකු සඳහා වූ සාමාන්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව 22 ක් විය.</td>
<td>i විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨවලට අදාල ශිෂ්‍ය සංඛ්‍යාව සහ ආචාර්යවරුන්ගේ සංඛ්‍යාවන් වෙනස් වන අතර එය පොදු අනුපාතයක් ලෙස සැළකිය නොහැක. සාමාන්‍ය ශිෂ්‍ය සහ ආචාර්ය අනුපාතය 10:1 විය යුතු වුවද ආචාර්යවරුන්ගේ හිගය නිසා අනුපාතය 22:1 වී ඇත.</td></tr>
<tr><td>ii සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු 1,075,128,589ක් වූ අතර ඒක ශිෂ්‍ය පිරිවැය රු.218,123 ක් වී තිබුණි.</td>
<td>ii විශේෂයෙන් 2011 වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩල දීමනා වැඩිවීම මත පුද්ගල පාරිශ්‍රමික වියදම් වැඩිවී ඇති අතර වෙනත් කොන්ත්‍රාත් සේවාවන් (උදා විදුලිය,දුරකථන ගාස්තු, ආරක්ෂණ සේවා,පිරිසිදු කිරීමේ සේවා) පිරිවැය වැඩිවීම මෙම ශිෂ්‍ය ඒකක පිරිවැය වැඩිවීමට හේතුවී ඇත.</td></tr>
</table>

iii සමාලෝචිත වර්ෂය තුල උපාධි අපේක්ෂකයින් 861 කට හා උපාධි අපේක්ෂිකාවෝ 247 කට නේවාසිකාගාර පහසුකම් සලසා තිබුණි.	Iii නේවාසිකාගාර පහසුකම් සැපයිය හැකි සියලුම ශිෂ්‍යයන්ට නේවාසිකාගාර පහසුකම් සලසා ඇත.
(අා) සමාලෝචිත වර්ෂය තුළ මහපොළ ශිෂ්‍යත්ව අධාර වශයෙන් ශිෂ්‍යයින් 2484 කට රු. 10,310,400 ක් ගෙවා තිබු අතර ශිෂ්‍යාධාර වශයෙන් ශිෂ්‍යයින් 805 කට රු. 4,945,300 ක් ගෙවා තිබුණි.	(අා) සියලුම සුදුසුකම් ලබන ශිෂ්‍යයන් සදහා ශිෂ්‍යාධාර හා මහපොල ගෙවීම් කරනු ලැබේ.
(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1995 ජුලි14 දිනැති හා අංක 636 දරණ චක්‍රලේඛය අනුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විභාගයන් පවත්වා මාස 03 ක් ඇතුලත ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවද, 2010 වර්ෂයේ සහ 2011 වර්ෂ වලදී පැවැත්වු විභාග වල ප්‍රතිඵල නිකුත් කිරීම මාස 04 සහ මාස 08 ක කාල පරාසයක් තුල ප්‍රමාද වු අවස්ථා 10 ක් නිරීක්ෂණය විය.	(ඇ) 2010/2011 වර්ෂවලට අදාලව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විභාග 86 ක් පවත්වා ඇති අතර, එයින් පීඨ 03 කට අදාලව දක්වා ඇති විභාග 10 ක් ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වීම නොවැළැක්විය හැකි හා අනපේක්ෂිත තත්ත්වයන් මත සිදුවුවක් බව දන්වමි. තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 636 අනුව විශ්වවිද්‍යාලවල ප්‍රතිඵල නිකුත් කිරීම මාස 03 ක් ඇතුලත අනිවාර්යයෙන්ම සිදුකල යුතු බවට දන්වා නොමැති බවද දන්වන අතර 2010/2011 වර්ෂවල මාස 03 ක කාලය තුල ප්‍රතිඵල නිකුත් කිරීම 90% ක් පමණ වන බවද දන්වමි. කෙසේ වුවද සියලුම විභාග ප්‍රතිඵල නිකුත් කිරීම මාස 03ක් තුල සිදුකිරීමට අවශ්‍ය උපදෙස් දී ඇති අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවරයන්ද ක්‍රියාත්මක කරඇත.

(ඇ) එක් උපාධි පාඨමාලාවක පළමු අර්ධ වර්ෂයේ (1st Semester) ප්‍රතිඵල නිකුත් කිරීමට ගතකර ඇති කාලය, එම පාඨමාලාවට අදාල සිසුන්ගේ දෙවන අර්ධ වර්ෂයේ (2nd Semester) විභාගය පැවැත්වූ දිනයෙන් පසු දිනයක් දක්වාම ප්‍රමාද වී පැවතුණි.	(ඇ) දක්වා ඇති උපාධි පාඨමාලාවට අදාල ප්‍රතිඵල නිකුත් කිරීමේදී ඇතිවූ අනපේක්ෂිත තත්ත්වයන් මත මෙම ප්‍රමාදය සිදුවී ඇත. ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් ඇති නොවීමට අවශ්‍ය උපදෙස් දී ඇති අතර අවශ්‍ය පියවරයන්ද ගෙන ඇත.
4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා	
(අ) මොරටුව විශ්වවිද්‍යාලයට අයත් අංක 52-1943 දරණ වාහනය 2010 අප්‍රේල් 29 වැනි දින අනතුරකට භාජනය වී තිබුණු අතර වාහනය අළුත් වැඩියා කිරීමකින් තොරව 2012 මැයි 08 දිනට ද විශ්වවිද්‍යාල භූමියේ ගාල්කර තිබේ. මෙම වාහනය අනතුරකට භාජනය වීම නිසා විශ්වවිද්‍යාලයට සිදුවූ අලාභය අදල රක්ෂණ ආයතනයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි	(අ) අංක 52-1943 දරණ වාහනය අනතුරට ලක්වීමෙන් පසු රක්ෂණ ආයතනයට දැනුම් දී ඇති අතර අලුත්වැඩියාවන්ට අදාල මිළගණන් කැඳවීමෙන් පසු නීතිමය කටයුතු අවසන් වන තෙක් අලුත්වැඩියාවන් සිදුනොකර වාහනය රදවාගෙන ඇත. දැනට නීතිමය කටයුතු අවසන්ව ඇති බැවින් මේ සම්බන්ධයෙන් ගතහැකි විකල්ප ක්‍රියා මාර්ග කෙරෙහි අවධානය යොමුකර පහත සඳහන් පරිදි කටයුතු කිරීමට තීරණය කර ඇත. 1 වාහනය අලුත්වැඩියාව සඳහා නැවත මිළගණන් කැඳවීම 2 රජයේ තක්සේරුකරුගේ තක්සේරු වාර්තාවක් ලබාගැනීම 3 හානිපූරණය වෙනුවෙන් රක්ෂණ ආයතනයෙන් ලබාගතහැකි උපරිම වන්දිය නිශ්චය කර ගැනීම 4 ඉහත තත්වයන් සලකා බලා විශ්වවිද්‍යාලයට ලබාගත හැකි උපරිම වාසිය ලබාගැනීමට කටයුතු කිරීම ඒ අනුව ඉහත කටයුතු ක්‍රියාත්මකව ඇති අතර ඉතා ඉක්මනින් මෙම කාර්යයන් අවසන් කිරීමට සැලසුම් කර ඇත.

(ආ) ඇතැම් ආචාර්යවරුන් ලබාගෙන ඇති පර්යේෂණ අවසන් කළයුතු දිනය ඉකුත් වී තිබියදී එම පරීක්ෂණය සම්පූර්ණ කිරීමට ප්‍රථමව නැවත පර්යේෂණ වෙනුවෙන් සනාතන පර්යේෂණ කමිටුව අනුමැතිය ලබාදී තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	(ආ) යම් ආචාර්යවරයකුට දැනට අනුමැතිය දී ඇති ව්‍යාපෘතියක් නිම කිරීමට කල් ඉල්ලා ඇති අවස්ථාවකදී සනාතන පර්යේෂණ කමිටුව මගින් එය තක්සේරු කර බලා අවශ්‍ය කාලය ලබාදෙනු ලැබේ. නව පර්යේෂණ ව්‍යාපෘති වෙනමම තක්සේරු කර ඒ සඳහා අනුමැතිය ලබාදීමේදී එම ආචාර්යවරයා විසින් දැනට කරගෙන යන ව්‍යාපෘති පිළිබඳව ද සනාතන පර්යේෂණ කමිටුව විසින් සලකා බලා අනුමැතිය දෙනු ලැබේ. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් තමන්ගේ විශ්වවිද්‍යාල ඉගැන්වීමේ රාජකාරි කටයුතු, විශ්වවිද්‍යාලයට සම්බන්ධ වෙනත් කටයුතු සහ වෙනත් ජාතික වැදගත්කමින් යුත් කාර්යයන්ට අමතරව සිදුකරන කාර්යයක් බැවිනුත්, විශ්වවිද්‍යාලයන්හි පර්යේෂණ සිදුකිරීම ඉතා වැදගත් අංගයක් ලෙස සලකන බැවිනුත්, නව පර්යේෂණයක් ආරම්භ කිරීමට සිදු කරමින් පවතින පර්ශේෂණ අවසන් කිරීම අනිවාර්ය නොවන බැවිනුත්, පර්යේෂණ කරගෙන යාමේදී ඇතිවන අපහසුතාවයන් ආදියද සලකා බලා පර්යේෂණ සඳහා අනුමතිය ලබාදීම සිදුකරන බවද දන්වමි.
(ඇ) සනාතන පර්යේෂණ කමිටුව මගින් නිර්දේශ කර රු. 26,379,050 ක මුදල් වෙන් කරන ලද පර්යේෂණ 88 ක අවසන් කළ යුතු කාලය ඉකුත් වී තිබුණද අදාල පර්යේෂණ මේ දක්වා අවසන් කර නොතිබුණි.	(ඇ) දක්වා ඇති සනාතන සහ පර්යේෂණ සම්බන්ධ ප්‍රගතිය සහ වර්තමාන තත්වය (2012.08.02 දිනට) පහත පරිදි වේ. 1 පර්යේෂණ සම්පූර්ණ කල සහ අවසාන වාර්තා ඉදිරිපත් කල 22 2 පර්යේෂණ සම්පූර්ණ කල සහ අවසාන වාර්තා ඉදිරිපත් කල යුතු 01 3 අවසාන පර්යේෂණ වාර්තා ලැබිය යුතු 53

	4 පර්යේෂණ කාලය දීර්ඝ කරන ලද 12 ඒ අනුව අවසාන පර්යේෂණ වාර්තා ලැබිය යුතු ආචාර්යවරු 53 දෙනාගේ වාර්තා ඉක්මණින් ලබා ගැනීමට කටයුතු කර ඇත.
(ඈ) දේපලක අයිතිය වෙනස් වී සති 08ක් ඇතුලත පළාත් පාලන ආයතනයට දැනුම් දී නව අයිතිය ලේඛනගත කරවා ගැනීමට කටයුතු කලයුතු වුවත්, එසේ නොමැතිව දේපල හයක් සඳහා පෙර අයිතිකරුගේ නමින් වරිපනම් බදු මුදල් ගෙවා තිබුණි.	(ඈ) විශ්වවිද්‍යාලයට අයත් ගොඩනැගිලි සහිත ඉඩම් වල අයිතිය නිරවුල් කර විශ්වවිද්‍යාලයට පවරා ගැනීම සඳහා මොරටුව මහ නගර සභාව සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය සමග සාකච්ඡා කර ඇත. තවද මෙම කටයුතු පිළිබඳ විශේෂ දැණුමක් සහිත බාහිර උපදේශකයකුගේ සේවය ලබාගන ඉඩම් වල අයිතිය නිරවුල් කරගැනීමට අවශ්‍ය විධිවිධාන යොදා ඇත.
(ඉ)යෝජිත බහුකාර්ය ශ්‍රවණාගාර ව්‍යාපෘතියේ උපදේශක සේවා ගාස්තු වන රු.1,273,329 ක් පෞද්ගලික ආයතනයට 2005 වර්ෂයේදී ගෙවා එම වියදම කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගතකර තිබු අතර එම ව්‍යාපෘතියේ කටයුතු මේ දක්වා ආරම්භ කර නොතිබුණි.	(ඉ)මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුලික කටයුතු සඳහා වැය කරන ලද මුදල් දැනට කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගත කර ඇත. මෙම ගොඩනැගිල්ල සඳහා ප්‍රමුඛත්වය මත අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම නිසා ඉදිකිරීම් ප්‍රමාද වී ඇති හෙයින් ඉදිරියේදී මෙම ඉදිකිරීම් ආරම්භ කරන තුරු මෙම වියදම් කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගත කිරීමට සිදුවී ඇති බව දන්වමි.

4 .3 අරමුදල් ඌන උපයෝජනය	
(අ) අරමුදල් ගිණුම් 09 කට අදාල රු. 1,330,165 ක ශේෂයක් 2011 වර්ෂයේ අක්‍රියව පැවතුණි.	(අ)දක්වා ඇති අරමුදල් ගිනුම් ශේෂයන්, නිශ්චිත කාර්යයන් / දෙපාර්තමේන්තු / පාඨමාලා සංවර්ධන කටයුතු සඳහා ජනිත කරනු ලබන ආදායම් වලින් සහ නිශ්චිත සංවර්ධන කාර්යයන් සඳහා ලැබෙන මුදල් සම්බන්ධ ගිණුම් ශේෂයන් වන අතර අදාල නිශ්චිත සංවර්ධන කාර්යයන් වලට භාවිතා කරන තෙක් අඛන්ඩව පවත්වාගන යා යුතුවේ. 2011 වර්ෂයේදී මෙම ගිණුම් ක්‍රියාත්මක නොවුවද ඉදිරි වර්ෂවලදී ඇතිවන අවශ්‍යතාවයන් වෙනුවෙන් රඳවා තබා ගත යුතු අතර මෙම ගිණුම් අක්‍රිය අරමුදල් ලෙස සැලකිය නොහැක.
(ආ)ආසියානු සංවර්ධන බැංකු ශිෂ්‍යත්ව අරමුදල් ගිණුම් රු. 938,701 ක ශේෂය 2007 වසරේ සිට අක්‍රියව පැවතුණි.	(ආ) මෙම ආසියානු සංවර්ධන බැංකු ශිෂ්‍යයත්ව අරමුදල් ගිණුම පවත්වාගෙන යනු ලබන්නේ අදාල ශිෂ්‍යත්ව සඳහා ලැබුන මුදල් ගිණුම්ගත කිරිම වෙනුවෙනි. දැනට මෙම ශිෂ්‍යත්ව ප්‍රධානය සිදුනොකිරිම නිසා ගිණුමේ ක්‍රියාකාරිත්වය නොමැතිව වුවද ඉදිරි කාලවලදී ඇති වන අවශ්‍යතාවයට යොදා ගැනිම සඳහා මෙම මුදල් අවශ්‍ය වේ. එම නිසා මෙම අරමුදල දැනට විශ්වවිද්‍යාල ආදායමට ගැනිමට හැකියාවක් නොමැත.
4.4 නිෂ්ක්‍රිය ඌණ උපයෝජිත වත්කම් මොරටුව විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්‍ෂණ විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති ඩීසල් ජෙනරේටරයට අදාල ඉන්ධන ටැංකියට නල මගින් ඉන්ධන සැපයීම සඳහා ලීටර් 12500 ක භුගත ඉන්ධන	තොරතුරු තාක්‍ෂණ පීඨ ගොඩනැගිල්ල අදියර 03කින් සමන්විත වන අතර දැනට අවසන් කර ඇතතේ අදියර 01 ට අදාල වැඩ කොටස් පමනි. මෙම ඉන්ධන ටැංකිය අදියර 1 ට අදාල වන බැවින් ඉදිකර ඇත එනමුත් මෙම අදියරයන් සියල්ල අවසන් වනතුරු මෙය

ටැංකියක්ද ස්ථාපිත කිරීම වෙනුවෙන් දරා තිබු වියදම රු.1,481,400 කි. මෙම ඉන්ධන ටැංකිය ස්ථාපනය කර වසර 03 ක් ආසන්න වී ඇතත් මේ දක්වා එය ප්‍රයෝජනයටගෙන නොතිබුණි.	සම්පුර්ණයෙන් භාවිතයට ගැනීමට හැකියාවක් නොමැත. තවද ඉන්ධන මගින් විදුලිය උත්පාදනය කරනු ලබනුයේ විදුලය විසන්ධි වන සහ සිදලීම් කරන අවස්ථා වලදී වන අතර මෙය දිගුකල් සැලසුම් මත ඉදිකරනු ලද්දක් වන අතර දෛනිකව භාවිතා කිරීමට කරන ලද ඉදිකිරීමක් නොවන බවද දන්වමි.
5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය	
5.1 සංයුක්ත සැලැස්ම 2010-2015 සංයුක්ත සැලැස්ම අනුව 2011 වර්ෂයේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වු පශ්චාත් උපාධි පාඨමාලා 03 ක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.	**දැනට පවත්වාගන යනු ලබන අභ්‍යන්තර උපාධි පාඨමාලා සහ අනෙකුත් පශ්චාත් උපාධි පාඨමාලා සමග මෙම පාඨමාලාවන් ආරම්භ කිරීමට අවශ්‍ය සම්පත් සපයා ගැනීමේ (ආචාර්යවරුන්ගේ හිගය,ජල සම්පත් කළමණාකරන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ වැඩ අවසන් නොවීම ආදිය) අපහසුතාවයන් මත 2011 වර්ෂයේදී මෙම පාඨමාලා ආරම්භ කිරීමට නොහැකිවී ඇත.**
5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම	
2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2012 මැයි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	**උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වාර්ෂික වාර්තා සකස් කිරීම සම්බන්ධ ආකෘතිය වෙනස් කිරීම නිසා නැවත ඒ අනුව සකස් කිරීමට සිදුවිය. දැනට එම** කටයුතු අවසන් කර **විශ්වවිද්‍යාල පාලක සභා අනුමතිය ලබාගන ඇති අතර පාර්ලිමේන්තුවේ** සභාගත කිරීමට කටයුතු යොදා ඇත.
5.3 අයවැය පාලනය ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් රු. 4,000,000 ක මුදලක් වාර්ෂික අයවැය මගින් ඇස්තමේන්තු කර ඇතත්, සමාලෝචිත වර්ෂයේ එම	(i) Ext. to Rock Mechanic Lab බාහිර ප්‍රදානයන් මගින් (Madanjeet Singh Fund) ප්‍රතිපාදන ලැබීම නිසා මෙම ප්‍රතිපාදන අවශ්‍ය නොවීය.

ව්‍යාපෘති දෙක සඳහා වියදම් දරා නොතිබුණු අතර, අයවැයගත ආදායම් වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.	(ii) Female Hostel for 400 Students දන්වා ඇති ව්‍යාපෘතියෙහි වියදම සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවද ප්‍රමාදතාවය මත මෙම ව්‍යාපෘතිවල අදාල ඉදිකිරීම් සිදුනොකිරීම නිසා වියදම් සිදුවී නොමැත.
6 පද්ධති හා පාලන විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින් වර උපකුලපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුයි. (අ) පශ්චාත් උපාධි පාඨමාලා ආදායම් (ආ) ණය අයකිරීම (ඇ) ගිවිසුම් කඩකිරීම් (ඈ) පර්යේෂණ (ඉ) මුල්‍ය පාලනය (ඊ) ලෙජර පැවැත්වීම (උ) ජරනල් සටහන් (ඌ) උපයෝගී ලේඛන	අභ්‍යන්තර පාලන ක්‍රම විධිමත් කිරීම, පුහුණු වැඩසටහන් මගින් කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ දැනුවත් කිරීම, පසුගිය ක්‍රියාකාරකම් නැවත සමාලෝචනය කිරීම ආදිය මගින් පද්ධති හා පාලන අඩුපාඩු ඇති නොවීමට කටයුතු යොදා ඇත.

මහාචාර්ය ඒ.කේ.ඩබ්ලිව්.ජයවර්ධන

උපකුලපති,

මොරටුව විශ්වවිද්‍යාලය.

23.8 ව්‍යවස්ථාපිත මණ්ඩලවල මූල්‍ය කාර්යසාධනය – 2011

1. ව්‍යවසායේ නම සහ ලිපිනය මොරටුව විශ්වවිද්‍යාල

2. මෙහෙවර ප්‍රකාශය - පහත සදහන් ආකාරයට ආසියාවේ තාක්ෂණික සහ අදල විෂයයන් සදහා වූ ප්‍රමුඛ ව්‍යවසාය මධ්‍යස්ථානය බවට පත් කිරීම.

- මනස විමසීම පෝෂණය කරන සහ අභියෝගයන්ගේ විවිධත්වයක් සඳහා නිපුනතා වැඩිදියුණු කරන පරිවර්තනාත්මක අධ්‍යාවපනය සැපයීමෙන්;
- දැනුමේ සීමාවන් පුළුල් කිරීමට ජාතිකව අදාළ සහ ඉහළතම බලපෑමක් සහිත පර්යේෂණ කරගෙන යාමෙන්;
- ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමෙන් සහ තාක්ෂණික හුවමාරුවට පහසුකම් සැලසීමෙන්;
- අන්තර්ජාතිකව ස්ථානගත වූ ජාතික විශ්වවිද්‍යාර්ලයක් ලෙස රජයට, කර්මාන්තයට සහ සමාජයට විශේෂඥ සේවා සැපයීමෙන්; සහ
- ශ්‍රී ලංකාවේ තිරසාර, විද්‍යාත්මක, තාක්ෂණික, සමාජයීය සහ ආර්ථික සංවර්ධනයට දායකවීමෙන්.

ආසියාවෙහි තාක්ෂණිකමය සහ ආශ්‍රිත පුහුණු කිරීම් සඳහා ප්‍රමුඛ දැනුම් ව්‍යවසාය වීම

3. ප්‍රධාන කටයුතු

ඉගැන්වීම,පර්යේෂණ කටයුතු උපදෙස් දීම සහ ඉංජිනේරු විද්‍යාව,වාස්තු විද්‍යාව,තොරතුරු තාක්‍ෂනය සහ ආශ්‍රිත තාක්‍ෂණ ක්ෂේත්‍ර වල අනෙකුත් වෘත්තිමය කටයුතු.

4 කාර්ය සාධන ප්‍රවණතාවය

			2007	2008	2009	2010	2011
	ආදායම් හා වියදම්						
1	රජයේ ආධාර පුනරාවර්තන	රු.'000	606,347	660,000	717,900	773,200	875,881
2	පුනරාවර්තන ස්වයං අයභාර	රු.'000	7,410	9,533	10,466	11,405	18,221
3	වෙනත් පුනරාවර්තන ප්‍රතිපාදන (මහපොළ ශිෂ්‍යාධාර ආදිය)	රු.'000	21,721	24,471	19,531	17,771	15,368
4	මුළු පුනරාවර්තන ආදායම (1+2+3)	රු.'000	**635,478**	**694,004**	**747,897**	**802,376**	**909,470**
5	සේවා නියුක්තයන්ගේ මුළු පිරිවැය	රු.'000	447,282	464,522	513,557	531,797	617,004
6	වෙනත් පුනරාවර්තන වියදම් (ක්ෂය හැර)	රු.'000	214,328	249,879	289,074	278,829	294,102
7	අතිරික්තය/ඌනතාවය (3-(4+5)	රු.'000	**(26,132)**	**(20,397)**	**(54,734)**	**(8,250)**	**(1,636)**
8	රජයේ ආධාර - මූලධන	රු.'000	336,161	304,000	182,000	168,000	252,478
9	වෙනත් ප්‍රතිපාදන - මූලධන	රු.'000	9,657	45,922	44,870	-	20,439
10	උත්පාදිත අරමුදල් - මූලධන	රු.'000	31,103	34,682	13,867	15,570	23,791
11	මූලධන වියදම් - රජයේ ප්‍රතිපාදන	රු.'000	336,161	304,000	182,000	168,000	262,321
	වත්කම් හා වගකීම්						
12	ආයෝජන	රු.'000	37,098	38,164	70,018	143,289	343,018
13	ජංගම නොවන වත්කම්	රු.'000	1,609,208	1,816,588	1,896,148	1,920,955	2,077,375
14	ජංගම වත්කම්	රු.'000	72,075	134,011	154,210	195,326	264,805
15	ජංගම වගකීම්	රු.'000	179,881	260,339	297,278	368,990	414,807
16	ජංගම නොවන වගකීම්	රු.'000	83,550	125,396	194,245	240,174	350,120
17	විදේශ ආධාර/පරිත්‍යාග (සමුච්චිත)	රු.'000	890,713	892,167	898,804	917,858	972,338
18	සමුච්චිත අරමුදල	රු.'000	564,235	710,860	730,050	732,548	947,933
19	සේවක සංඛ්‍යාව - අධ්‍යයන	ගණන	384	399	375	388	400
20	මුළු සේවක සංඛ්‍යාව	ගණන	967	872	975	1,009	993
21	ශිෂ්‍ය සංඛ්‍යාව	ගණන	4,768	4,285	4,740	5,504	4,745
	ප්‍රධාන කාර්ය සාධන දර්ශක						
i.	මුළු අයභාරයට ස්වයං අයභාරය	%	1.17	1.37	1.40	1.42	2.00
ii.	සේවකයකු සඳහා සේවා නියුක්ති මුළු පිරිවැය	රු.'000	463	533	527	527	621
iii.	ශිෂයයකු සඳහා සේවා නියුක්ති මුළු පිරිවැය	රු.'000	94	108	108	97	130
iv.	වර්ෂයකට ශිෂයයකු සඳහා පුනරාවර්තන ප්‍රතිපාදන	රු.'000	133	162	158	146	192
v.	උපාධිධාරියකු සඳහා මුළු පිරිවැය	රු.'000	427	503	565	599	657
vi.	ප්‍රතිඵල නිකුත් කර මාස තුනක්තුල සේවා නියුක්තිභාවය	%	95	97	95	95	96
vii	ශිෂ්‍ය - කාර්ය මණ්ඩල අනුපාතනය	ගණන	5:01	5:01	5:01	5:01	5:01
vii	ශිෂ්‍ය - අධ්‍යයන කාර්ය මණ්ඩල - අනුපාතය (තත්‍ය)	ගණන	12:01	11:01	13:01	14:01	12:01
ix.	ශිෂ්‍ය - වාහන අනුපාතය	ගණන	198.01	178.01	180.01	190:01	164:01